සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 02 |

උපදෙස් :

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(01) නිෂ්පාදන ආයතනයක් තම උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායිතාවයෙන් යුතුව නිෂ්පාදනයේ නිරත වී සිටිය ද එම ආයතනය සම්බන්ධයෙන් ''අත්පත් කරගත නොහැකි නිමැවුම් සංයෝගයක් දක්නට ලැබේ.'' මෙම ප්‍රකාශයෙන් විස්තර වන ආර්ථික විද්‍යාත්මක සංකල්පය වනුයේ,

1) ආවස්ථික පිරිවැයයි.
2) තේරීමේ ගැටළුවයි.
3) සම්පත් ඌන උපයෝජනයයි.
4) වුවමනාවන්ට සාපේක්ෂව සම්පත් වල පවතින සීමිත බවයි.
5) අකාර්යක්ෂම සම්පත් භාවිතයයි.

(02) කිසියම් ආර්ථිකයක් "ආර්ථික කාර්යක්ෂමතාවය" අත්පත් කරගෙන ඇතැයි සිතන්න. එම අවස්ථාව කරා ළඟා වීමේදී අනිවාර්යයෙන්ම ඉටුවිය යුතු කොන්දේසිය වනුයේ,

1) පූර්ණ සේවා නියුක්තිය යි.
2) පූර්ණ නිෂ්පාදනය යි.
3) නිෂ්පාදන කාර්යක්ෂමතාවය යි.
4) ආන්තික පිරිවැය ඉක්ම වූ ආන්තික ප්‍රතිලාභයක් ලැබීමයි.
5) ආන්තික පිරිවැය ආන්තික ප්‍රතිලාභයට හෙවත් මිලට සමාන වීමයි.

(03) ආර්ථික පසුබැසීම හා ආර්ථික අවපාතය යන සංකල්ප වඩාත් ම තාර්කික ලෙස විස්තර කරනුයේ,

1) ආර්ථික පසුබෑම කෙටි කාලීන තත්වයක් වන අතර ආර්ථික අවපාතය දිගුකාලීන තත්වයකි.
2) ආර්ථික පසුබෑමකදී නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ඇතුළත ලක්ෂ්‍යයක කටයුතු කරන අතර ආර්ථික අවපාතයකදී නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වේ.
3) ආර්ථික පසුබෑමක උග්‍රතම අවස්ථාව වනුයේ ආර්ථික අවපාතයයි.
4) ආර්ථික පසුබැසීම තුළ ලැබී ඇති සම්පත් සම්භාරය ප්‍රශස්ත ලෙස භාවිතා නොකරන බැවින් අකාර්යක්ෂම නිමවුම් මට්ටමකට ළඟා වන අතර ආර්ථික අවපාතයේ දී සම්පත් සම්භාරයට හෝ ඵලදායිතාවයට හානි සිදු වේ.
5) ආර්ථික පසුබෑම හා ආර්ථික අවපාතය යන දෙකම සම්පත් අකාර්යක්ෂම භාවිතයේ ප්‍රතිඵල වේ.

(04) පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

1) ඉල්ලුම් වක්‍රය මත ලක්ෂ්‍යයන් අතර ගමන් කිරීම ඉල්ලුම වෙනස් වීම නිරූපණය කරයි.
2) ඉල්ලුම් වක්‍රය මත කිසියම් ලක්ෂ්‍යයකින් ඉල්ලුම නිරූපණය කරයි.
3) ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීම ඉල්ලුම් ප්‍රසාරණය නිරූපණය කරයි.
4) ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීම ඉල්ලුම් සංකෝචනය නිරූපණය කරයි.
5) ඉල්ලුම් වක්‍රය මත ලක්ෂ්‍යයන් අතර ගමන් කිරීම ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස් වීම නිරූපණය කරයි.

(05) එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් ශ්‍රිතය $Qd = 120 - 2P$ වේ. මෙම භාණ්ඩයේ ප්‍රතිලෝම ඉල්ලුම් ශ්‍රිතය වනුයේ,

1) $P = 60 - Qd$ 2) $P = 60 - 0.5\ Qd$ 3) $P = 60 - 0.2\ Qd$
4) $P = 6 - 0.5\ Qd$ 5) $P = 6 - 0.2\ Qd$

(06) Y භාණ්ඩයෙහි සැපයුම් කරනු ලබන ප්‍රමාණය අඩු වීමට පහත කවරක් හේතු වේ ද?

1) අනිකුත් කරුණු නොවෙනස්ව තිබියදී Y භාණ්ඩයේ මිල පහළ යාම.
2) අනිකුත් කරුණු නොවෙනස්ව තිබියදී Y භාණ්ඩයේ මිල ඉහළ යාම.
3) Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේදී අනුපූරක භාණ්ඩයක් ලෙස ක්‍රියා කරන X භාණ්ඩයේ මිල පහළ යාම.
4) Y භාණ්ඩයේ නිෂ්පාදන සම්පත් වල මිල ඉහළ යාම.
5) Y භාණ්ඩය සඳහා භාවිතා කරන තාක්ෂණය පහළ යාම.

(07) පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයක අධි ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණය වේ.

$$Qed = 28 - 7P$$
$$Qs = -8 + 6P$$

මෙහි සමතුලිත මිල හා ප්‍රමාණය වන්නේ,

1) රු. 4 හා ඒකක 56 2) රු. 4 හා ඒකක 16 3) රු. 7 හා ඒකක 20
4) රු. 16 හා ඒකක 34 5) රු. 28 හා ඒකක 56


(08) සීනි සඳහා ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට බලපාන හේතු මොනවාද ?

1) සීනි මිල පහළ යාම. 2) හකුරු මිල ඉහළ යාම.
3) තේ කොළ මිල ඉහළ යාම. 4) සීනි නිෂ්පාදන පිරිවැය ඉහළ යාම.
5) සීනි පරිභෝජනය කරන ජනතාවගේ ආදායම ඉහළ යාම.

(09) කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් වෙළඳපොළ සමතුලිතයේ දී ඇතිවිය හැකි අනිවාර්යය කොන්දේසිය වන්නේ,

1) නිෂ්පාදන අතිරික්තය හා පාරිභෝගික අතිරික්තය සමාන වීමයි.
2) අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල සමාන වීමයි.
3) අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ශූන්‍ය වීමයි.
4) අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය සමාන වීමයි.
5) නිෂ්පාදන අතිරික්තය හා පාරිභෝගික අතිරික්තය ශූන්‍ය වීමයි.

(10) S හා $S_1$ සැපයුම් වක්‍ර පිළිබඳ පහත දැක්වෙන කවර ප්‍රකාශය සත්‍ය වේද ?




| | S<br>සැපයුම් වක්‍රයේ සෑම ලක්ෂ්‍යයකදීම නම්‍යතාව | $S_1$<br>සැපයුම් වක්‍රය දිගේ ඉහළ ගමන් කරන විට නම්‍යතාව |
|---|---|---|
| 1) | ඒකීය වේ. | එකට ආසන්න වන තෙක් පහළ යයි. |
| 2) | ඒකීය වේ. | එකට ආසන්න වන තෙක් ඉහළ යයි. |
| 3) | එකට අඩු වේ. | එකට ආසන්න වන තෙක් පහළ යයි. |
| 4) | එකට වැඩි වේ. | එකට ආසන්න වන තෙක් ඉහළ යයි. |
| 5) | ඒකීය වේ. | ක්‍රමයෙන් වැඩි වේ. |

(11) 20 - 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය නැරඹීම සඳහා වූ ඉල්ලුම් තත්ත්වය $Qd = 90000 - 100P$ යැයි පුරෝකථනය කර තිබූ අතර ක්‍රීඩාංගනයේ පැවති මුළු ආසන සංඛ්‍යාව 50 000 කි. මෙම තොරතුරු අනුව ටිකට් පතක සමතුලිත මිල වනුයේ,

1) රු. 100 2) රු. 200 3) රු. 400 4) රු. 900 5) රු. 1400


(12) පාන්පිටි සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව එකට වඩා අඩු යැයි සලකන්න. පාන්පිටි නිෂ්පාදනය මත නිෂ්පාදන බද්දක් පැනවූ විට මිල, ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය හා පාරිභෝගික පැහැදම කවර ආකාරයෙන් වෙනස් වේද ?

| | මිල | ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය | පාරිභෝගික පැහැදම |
|---|---|---|---|
| 1) | අඩු වේ. | වැඩි වේ. | වැඩි වේ. |
| 2) | අඩු වේ. | අඩු වේ. | අඩු වේ. |
| 3) | වැඩි වේ. | අඩු වේ. | අඩු වේ. |
| 4) | වැඩි වේ. | අඩු වේ. | වැඩි වේ. |
| 5) | වැඩි වේ. | වැඩි වේ. | වැඩි වේ. |

(13) කිසියම් භාණ්ඩයක් සඳහා ඉල්ලුම් සමීකරණය $Qd = 200 - 4P$ වේ. භාණ්ඩයේ ස්ථාවර සැපයුම ඒකක 100 කි. මෙම භාණ්ඩය අලෙවි කළ යුතු උපරිම මිල රු. 20/- යැයි රජය තීරණය කළහොත් වෙළඳපොළේ ඇති වන භාණ්ඩ හිඟය හා පාරිභෝගික අතිරික්තය වෙනස් වූ ප්‍රමාණය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද ?

| | භාණ්ඩ හිඟය | පාරිභෝගික අතිරික්තයේ වෙනස |
|---|---|---|
| 1) | 20 | 500 |
| 2) | 20 | 550 |
| 3) | 80 | 500 |
| 4) | 80 | 550 |
| 5) | 100 | 1000 |

(14) එක්තරා භාණ්ඩයකට රජය විසින් ඒකක සහනාධාරය ලබා දීමෙන් අනතුරුව වෙළඳපොළ තත්වය පහත වේ.





රූප සටහනට අනුව සහනාධාරය සඳහා රජය දරන වියදම හා අහිමි වන සමාජ සුභසාධනය පිළිබඳ පහත දැක්වෙන අගයන් අතරින් නිවැරදි අගයන් දැක්වෙන පිළිතුර කුමක්ද ?

| | සහනාධාරය සඳහා රජයේ වියදම (රු.) | අහිමි වන සමාජ සුභසාධනය (රු.) |
|---|---|---|
| 1) | 4000 | 500 |
| 2) | 4000 | 1000 |
| 3) | 6000 | 1000 |
| 4) | 8000 | 500 |
| 5) | 8000 | 1000 |

(15) නිෂ්පාදන ක්‍රියාවලියක් සම්බන්ධයෙන් දිගු කාලයේදී,

1) නිෂ්පාදනය විචල්‍යය සාධක අනුපාත නීතියට අනුව ක්‍රියාත්මක වේ.
2) විචල්‍යය සාධක සහ ස්ථාවර සාධක යනුවෙන් සාධක දෙවර්ගයක් පවතී.
3) සියළුම යෙදවුම් ස්ථාවර යෙදවුම් බවට පත්වේ.
4) හීනවන ආන්තික ඵලදා නීතියට අනුව ක්‍රියාත්මක වේ.
5) කෙටි කාලය තුළ ස්ථාවරව පැවති සාධක ද විචල්‍යය සාධක බවට පත්වේ.

(16) පූර්ණ තරඟකාරී වෙළඳපොළක කටයුතු කරන නිෂ්පාදන ආයතනයක කෙටිකාලීන හැසිරීම පහත රූපසටහනේ දැක්වේ.



ඉහත රූප සටහනට අනුව ඔබට එකඟ විය හැකි ප්‍රකාශය වනුයේ,

1) මෙම නිමැවුම් මට්ටම් දෙකම ආයතනයට පවත්වා ගත හැකි ප්‍රශස්ත නිමැවුම් මට්ටම් නොවේ.
2) මිල රුපියල් 10 ක් වන නිමැවුම් ඒකක 250 දී ආයතනය ප්‍රාමාණික ලාභ උපයයි.
3) නිමැවුම ඒකක 500 ක් වන විට ආයතනය ආර්ථික ලාභ උපයයි.
4) මිල රුපියල් 20 ක් වන නිමැවුමට අදාළව ඒකක 500 ක් නිපදවන විට ආයතනය ප්‍රාමාණික ලාභ උපයයි.
5) ඒකකයක මිල රුපියල් 10 ක් වන විට ආයතනය වසා දැමිය යුතුය.


(17) එක්තරා නිමැවුම් ආයතනයකට අදාළ පිරිවැය තොරතුරු පහත වගුවේ දැක්වේ.

| භාණ්ඩ ඒකක | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| ආන්තික පිරිවැය (MC) (α) | 50 | 30 | 28 | 20 | 40 |

මෙම ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය 10 ක් වේ නම් සාමාන්‍ය මුළු පිරිවැය අවම වන නිමැවුම ඒකක කීයද ?

1) ඒකක 5 2) ඒකක 4 3) ඒකක 3 4) ඒකක 2 5) ඒකක 1

(18) පහත රූප සටහනේ දැක්වෙන නිෂ්පාදන සාධකයේ සංක්‍රාම ඉපැයීම හා ආර්ථික බදු කුලිය නිවැරදිව දැක්වූ විට,




| | සංක්‍රාම ඉපැයීම (රු.) | ආර්ථික බදු කුලිය (රු.) |
|---|---|---|
| 1) | 25 000 | 75 000 |
| 2) | 35 000 | 75 000 |
| 3) | 35 000 | 175 000 |
| 4) | 175 000 | 35 000 |
| 5) | 175 000 | 210 000 |

(19) රටක දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ඇතුළත් කරන අයිතමය වනුයේ,

1) පාවිච්චි කරන ලද මෝටර් රථ විකුණුම් ය.
2) රජය විසින් කෙටිකාලීන අරමුදල් සම්පාදනය සඳහා භාණ්ඩාගාර බිල්පත් විවෘත වෙළඳපොළ තුළ විකිණීමය.
3) අතරමැදි භාණ්ඩ හා සේවාවල වටිනාකමය.
4) දිළිඳු ප්‍රජාවට ලබාදෙන අස්වැසුම සහනාධාරය.
5) සලකා බලන වර්ෂය තුළ ඉදිකරන ලද නව නිවාසවල වටිනාකමය.

(20) ව්‍යාපාර චක්‍රයක ප්‍රසාරණාත්මක අවධියේදී, සිදුවිය හැක්කේ,

1) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම, සේවා වියුක්තිය ඉහළ යාම සහ උද්ධමනය ඉහළ යාමය.
2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම, සේවා වියුක්තිය පහළ යාම සහ උද්ධමනය ඉහළ යාමය.
3) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම, සේවා වියුක්තිය ඉහළ යාම සහ අවධමනය ඉහළ යාමය.
4) පොලී අනුපාතිකය ඉහළ යාම සහ ආයෝජන පහළ යාමය.
5) උද්ධමනය ඉහළ යාම, ආයෝජන ඉහළ යාම හා සේවා නියුක්තිය පහළ යාමය.

(21) වී වගා කරන ගොවීන් තම යල කන්නයේ වී අස්වැන්න රු. මිලියන 10 කට වී මෝල් හිමියන්ට අලෙවි කරයි. වී මෝල් හිමියන් එම වී තොගය මගින් රු. මිලියන 14.5 ක සහල් නිෂ්පාදනය කර සුපිරි වෙළඳසැල් වලට අලෙවි කරයි. එම සුපිරි වෙළඳසැල් ජාලය රු. මිලියන 16 කට පාරිභෝගිකයන්ට එම සහල් තොගය අලෙවි කරයි. මෙම නිෂ්පාදන ක්‍රියාවලිය තුළ වී මෝල් හිමියන් සහ සුපිරි වෙළඳසැල් ජාලය එකතු කළ අගය පිළිවෙලින්,

1) රු. මි. 1.5 ක් සහ රු. මි. 4.5 කි.
2) රු. මි. 1.5 ක් සහ රු. මි. 6 කි.
3) රු. මි. 4.5 ක් සහ රු. මි. 10 කි.
4) රු. මි. 4.5 ක් සහ රු. මි. 1.5 කි.
5) රු. මි. 6 ක් සහ රු. මි. 10 කි.

(22) කිසියම් රටක පොදු මිල මට්ටම පසුගිය වර්ෂයේදී ඉහළ ගිය නමුත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වෙනස් නොවූයේ නම්, පහත ප්‍රකාශ අතුරින් කුමක් නිවැරදි වේද ?

| | නාමික දළ දේශීය නිෂ්පාදිතය | මූර්ත දළ දේශීය නිෂ්පාදිතය |
|---|---|---|
| 1) | පහළ වැටුණි | ස්ථාවර විය. |
| 2) | ස්ථාවර විය. | ස්ථාවර විය. |
| 3) | ඉහළ ගියේය. | ස්ථාවර විය. |
| 4) | ඉහළ ගියේය. | ඉහළ ගියේය. |
| 5) | පහළ ගියේය. | පහළ ගියේය. |

(23) රජයේ වියදම් ගුණකයේ වටිනාකම වැඩි වන්නේ පහත කවර කරුණක් නිසාද ?

1) සමතුලිත නිමැවුම් මට්ටම.
2) මුදල් සැපයුම.
3) පෞද්ගලික ආදායම් බදු අනුපාතිකය.
4) ආන්තික පාරිභෝජන නැමියාව.
5) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය.


(24) සමතුලිත ජාතික ආදායම් මට්ටමක කටයුතු කරන එක්තරා ආර්ථිකයකට පහත දත්ත අදාළ වේ.

| | රු. බිලියන |
|---|---|
| * පාරිභෝජන වියදම | 8 000 |
| * බදු | 1 500 |
| * ආණ්ඩුවේ මිලදී ගැනීම් | 2 000 |
| * ආනයන | 2 500 |
| * අපනයන | 1 700 |
| * දළ දේශීය නිෂ්පාදිතය | 9 300 |

මෙම ආර්ථිකයේ ආයෝජන මට්ටම වනුයේ,

1) රු. බිලි. 100
2) රු. බිලි. 150
3) රු. බිලි. 300
4) රු. බිලි. 500
5) රු. බිලි. 700

(25) එක්තරා ආර්ථිකයක ඉතුරුම්වල ඇති වූ වෙනස්වීමක් නිසා සමාහාර පාරිභෝජන ශ්‍රිතය $C_1 - C_2$ දක්වා වෙනස්විය. එය පහත රූප සටහනේ දැක්වේ.




මෙම වෙනස්වීම ගුණකය සහ ආන්තික පරිභෝජන නැමියාවට කෙසේ බලපෑම් කරයිද ?

| | ගුණකය | ආන්තික පරිභෝජන නැමියාව |
|---|---|---|
| 1) | අඩු වේ. | වැඩි වේ. |
| 2) | වැඩි වේ. | අඩු වේ. |
| 3) | වැඩි වේ. | වැඩි වේ. |
| 4) | අඩු වේ. | අඩු වේ. |
| 5) | නොවෙනස් වේ. | වැඩි වේ. |

(26) රටක මුදල් ඉල්ලුම තීරණය වන්නේ,

1) පොලී අනුපාතිකය සහ මුදල් ගුණකයේ අගය මතය.
2) මුදල් ගුණකය හා අධිබලැති මුදල් මතය.
3) පොලී අනුපාතිකය සහ සේවා වියුක්තිය මතය.
4) පොලී අනුපාතිකය සහ අධිබලැති මුදල් මතය.
5) ආදායම් මට්ටම හා පොලී අනුපාතිකය මතය.

27) ණයපතක් කටයුතු කරන්නේ,

1) වටිනාකමේ සංනිධියක් වශයෙනි. 2) තාවකාලික හුවමාරු මාධ්‍යයක් වශයෙනි.

3) විලම්භිත ගෙවුම් මාධ්‍යයක් වශයෙනි. 4) ගිණුම් ඒකකයක් වශයෙනි.

5) ණය ගනුදෙනු පියවීමේ මාධ්‍යයක් වශයෙනි.

(28) 2023 නව මහ බැංකු පනත අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රමුඛ අරමුණ වන්නේ,

1) මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම ය.

2) දේශීය මිල ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම ය.

3) ව්‍යවහාර මුදලේ අගය ස්ථාවරව පවත්වා ගැනීම ය.

4) පොදු මිල මට්ටමේ වෙනස්වීම අඩු සහ ස්ථාවර මට්මක පවත්වා ගැනීම ය.

5) පොදු මිල මට්ටම හා මුදලේ ක්‍රය ශක්තිය ස්ථායිව පවත්වා ගැනීම ය.

(29) මහ බැංකු කාර්යයන් අතර විනිමය අනුපාත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් අතරට ඇතුළත් නොවනුයේ,

1) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ජංගම සහ ප්‍රාග්ධන ගනුදෙනු ප්‍රවර්ධනය හා නියාමනය කිරීම.

2) විදේශ විනිමය කළමනාකරණය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග සැකසීම.

3) බලයලත් වෙළෙඳුන් විසින් වාර්තා කරන ලද විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය කිරීම සහ එම තොරතුරු විශ්ලේෂණය කිරීම.

4) විදේශ විනිමය පනත ප්‍රකාරව අනුකූල නොවීම පිළිබඳව විමර්ශන පැවැත්වීම.

5) විදේශ මුදල් වෙළෙඳපොළ උපකරණවල ආයෝජනය.

(30) පොදු භාණ්ඩ වෙළෙඳපොළ ක්‍රමය මගින් සපයනු නොලබන්නේ,

1) පරිභෝජනයේ දී පිරිවැයක් ඇති වුවද, ලාභයක් ඉපැයීමට නොහැකි නිසාය.

2) මිලක් අය කළ නොහැකිවීම සහ පරිභෝජනයේ දී තරඟකාරීත්වයක් නොපැවතීම නිසාය.

3) මිලක් නොගෙවන අය පරිභෝජනයෙන් බැහැර කළ නොහැකිවීම සහ පරිභෝජනයේ දී තරඟකාරීත්වයක් නොපැවැතීම නිසාය.

4) මිලක් අය කළ හැකි වුවත් එය පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසාය.

5) ලාභයක් ඉපයිය හැකි වුවද පාරිභෝජනයේදී පිරිවැයක් පැවතීම නිසාය.

(31) අධිවේගී මාර්ගයක් ඉදිකිරීම නිසා හටගන්නා පෞද්ගලික හා බාහිර පිරිවැයත්, පෞද්ගලික හා බාහිර ප්‍රතිලාභත් පහත සඳහන් වගුව පෙන්නුම් කරයි.

| සංඛ්‍යා රුපියල් බිලියන වලිනි. | |
|---|---|
| පෞද්ගලික ප්‍රතිලාභ | 180 |
| පෞද්ගලික පිරිවැය | 190 |
| බාහිර ප්‍රතිලාභ | 110 |
| බාහිර පිරිවැය | 140 |

මෙම දත්තවලට අනුව, සමාජ පිරිවැය හා සමාජ ප්‍රතිලාභ අතර වෙනස වනුයේ,

1) රුපියල් බිලියන 120 කි. 2) රුපියල් බිලියන 50 කි.

3) රුපියල් බිලියන 40 කි. 4) රුපියල් බිලියන 30 කි.

5) රුපියල් බිලියන 10 කි.

(32) බද්දක් අය කිරීම නිසා සිදුවන විකෘති වීම් වළක්වා ලීමට ඇති හැකියාව බද්දක කවර ලක්ෂණයද ?

1) නම්‍යශීලී බව. 2) කාර්යක්ෂම බව 3) නිශ්චිත බව.

4) පහසු බව. 5) සාධාරණත්වය.

(33) වර්තමානයේ ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමෙහි විශාලතම සංරචකය වන්නේ,

1) පොලී ගෙවීම්. 2) වැටුප් හා වේතන. 3) විශ්‍රාම වැටුප් ගෙවීම.

4) පොහොර සහනාධාරය. 5) රාජ්‍ය සංස්ථා වර්තන පැවරුම්.

(34) ලෝකයේ බොහෝ රටවල් මෑත කාලීනව ආර්ථික පසුබැසීම් වලට මුහුණ දෙමින් සිටියි. එවැනි ආර්ථික ප්‍රතිගමන තත්ත්වයක් සමනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් වනුයේ පහත සඳහන් කවරක ඉහළ නැංවීමක් ද?

1) පොලී අනුපාතික 2) මුදල් සැපයුම 3) බදු

4) ආණ්ඩුවේ බැඳුම්කර අලෙවි කිරීම. 5) ආණ්ඩුවේ වියදම්.

(35) අන්තර්ජාතික වෙළෙඳාම ඔස්සේ කිසියම් රටකට,

1) නිෂ්පාදන හැකියා වක්‍රයෙන් පිටත ලක්ෂ්‍යයක නිෂ්පාදනය කළ හැකිය.

2) තම රටෙහි නිෂ්පාදන පිරිවැය පහළ දමා ගත හැකිය.

3) තම රටෙහි සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කර ගත හැකිය.

4) නිෂ්පාදන හැකියා මායිමෙන් පිටත පරිභෝජනය කිරීමට හැකිය.

5) පරිභෝජන හැකියාව නොවෙනස්ව තබා ගෙන නිෂ්පාදනය ප්‍රසාරණය කිරීමට හැකිය.

(36) සාපේක්ෂ වාසිය යනු,

1) එක් භාණ්ඩයක් අනික් රටට වඩා වැඩි ප්‍රමාණයක් නිපදවිය හැකි බවයි.

2) එක් භාණ්ඩයක් අනික් රටට වඩා අඩු ආන්තික පිරිවැයක් සහිතව නිපදවිය හැකි බවය.

3) එක් භාණ්ඩයක් අනික් රටට වඩා අඩු ආවස්ථික පිරිවැයක් සහිතව නිපදවිය හැකි බවයි.

4) නිෂ්පාදන හැකියා වක්‍රයෙන් පිටත නිපදවිය හැකි බවයි.

5) එක් භාණ්ඩයක් අනෙක් රටට වඩා අඩු සාමාන්‍ය පිරිවැයක් සහිතව නිපදවිය හැකි බවයි.

(37) සමස්ත ආර්ථික අනුකලනය යනු,

1) ගිවිසුම්ගත රටවල රාජ්‍ය මූල්‍ය, මූල්‍ය, සමාජ හා ප්‍රතිචක්‍රීය ප්‍රතිපත්ති සියල්ල ම සෑම අතින්ම සම මට්ටමකට පත් කොට ක්‍රියාත්මක කිරීමය.

2) ගිවිසුම්ගත හවුලේ රටවල ආර්ථික ප්‍රතිපත්ති අතර කිසියම් සමානත්වයක් ඇතිකර ගැනීමය.

3) නිෂ්පාදන සාධක, ශ්‍රමය සහ ප්‍රාග්ධනය ගිවිසුම්ගත රටවල් අතර බාධාවකින් තොරව සංචලනය වීමට ඉඩ සැලසීමය.

4) ගිවිසුම්ගත රටවල් විසින් ගිවිසුමෙන් පරිබාහිර රටවලින් සිදු කෙරෙන ආනයන සඳහා සමාන පොදු තීරුබදු අනුපාතිකයන් යොදා ගැනීමය.

5) ගිවිසුම්ගත රටවල් විසින් එකඟ වූ තීරු බදු කාණ්ඩවලට අයත් තීරුබදු මුලුමනින්ම ඉවත් කිරීමය.

(38) පහත දෑ අතරින් විදේශ ගෙවීම් වලට අයත් නොවන්නේ,

1) වාණිජ බැංකු මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීමය. 2) ප්‍රාග්ධනය ආපසු ගෙවීම්ය.

3) ආයෝජනය පිටතට ගලා යාම්ය. 4) සේවා ඉපැයීම්ය.

5) සාධක ආදායම් ගෙවීම්ය.

(39) කිසියම් ආර්ථිකයක ගෙවුම් ශේෂ ගිණුම තුළ,

1) මූල්‍ය ගිණුමේ ශේෂයත් ප්‍රාග්ධන හා ජංගම ගිණුමේ ශේෂයන්ගේ එකතුවත් එකිනෙකට එකතු කළ විට ශුන්‍යයට සමාන වේ.

2) ප්‍රාග්ධන ගිණුමේ ශේෂය හා ජංගම ගිණුමේ ශේෂය එකතු කළ විට අගය එකක් විය යුතුය.

3) ජංගම ගිණුමේ ශේෂය සෑම විටම ප්‍රාග්ධන ගිණුමේ ශේෂයට වඩා විශාලය.

4) ජංගම ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය යන දෙකම ශුන්‍ය අගයක් ගනී.

5) ප්‍රාග්ධන ගලායෑම් සහ ප්‍රාග්ධනය ගලා ඒම් එකිනෙකට සමාන විය යුතුය.

(40) ගෙවුම් ශේෂයේ හිඟයක් දිගින් දිගටම පවතී නම්, එම අගය පහළ දැමීමට මූල්‍ය අධිකාරීන් කටයුතු කිරීම හඳුන්වනුයේ,

1) ප්‍රති ප්‍රමාණය කිරීමක් ලෙස ය. 2) අව ප්‍රමාණය කිරීමක් ලෙස ය.

3) සම ප්‍රමාණය කිරීමක් ලෙස ය. 4) ක්ෂය කිරීමක් ලෙස ය.

5) අධි ප්‍රමාණය කිරීමක් ලෙස ය.

(41) චින යුආන් මුදල් ඒකකයේ වටිනාකමට ශ්‍රී ලංකා රුපියල් මිල සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ වැටුණොත්,

1) චීන පාරිභෝගිකයන්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩ සාපේක්ෂව ලාභදායි වේ.

2) චීනය තුළ ශ්‍රී ලංකාවේ රුපියල් සඳහා ඉල්ලුම වැඩිවේ.

3) ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ට චීනයේ භාණ්ඩ සාපේක්ෂව ලාභදායක වේ.

4) චීන සංචාරකයින් වැඩි වැඩියෙන් ශ්‍රී ලංකාවට පැමිණීම ධෛර්යමත් කෙරේ.

5) ශ්‍රී ලාංකික සංචාරකයන් චීනයට යාම අධෛර්යමත් කෙරේ.

(42) ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනීම රටකට ඉතා වැදගත්ය. මේ සඳහා වඩාත්ම වැදගත් සාධකය මේ අතරින් කුමක්ද ?

1) පර්යේෂණ සහ සංවර්ධනය සඳහා යොමු වීම. 2) පාරිභෝගික සහනාධාරය වැඩි කිරීම.

3) නිෂ්පාදන බදු ඉහළ දැමීම. 4) ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග වැඩි කිරීම.

5) ස්වාභාවික සම්පත් භාවිතය ඉහළ දැමීම.

(43) ආර්ථික සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ,

1) කාලයත් සමඟ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ හටගන්නා අඛණ්ඩ වැඩිවීමයි.

2) කාලයත් සමග දළ ජාතික ආදායමේ හටගන්නා අඛණ්ඩ ඉහළ යාමයි.

3) දළ ජාතික ආදායමේ තිරසාර ඉහළ යාමයි.

4) ආර්ථික වර්ධනය සමඟම ජන ජීවිතයේ ව්‍යුහාත්මක හා ගුණාත්මක වෙනස්කම් හට ගැනීමයි.

5) දරිද්‍රතාවය පහළ වැටීම හා ආදායම් ව්‍යාප්ති විෂමතාවය ඉවත්වීමයි.

(44) තිරසාර සංවර්ධනය සඳහා වන 2023 න්‍යාය පත්‍රයට අනුව ලොව සියලුම ජාතීන් එකඟතාව පළ කළ තිරසාර සංවර්ධන ඉලක්ක සංඛ්‍යාව කොපමණද ?

1) 10 2) 13 3) 17 4) 18 5) 20

(45) මානව සංවර්ධන දර්ශකයේ එක් සංරචකයක් වන්නේ,

1) පාසල් යන දරුවන් 1000 කට සිටින ගුරුවරු සංඛ්‍යාවයි.
2) වැඩිහිටි සාක්ෂරතා අනුපාතයයි.
3) පාසල් අධ්‍යාපනයට ප්‍රවේශ වන දරුවෙකු අධ්‍යාපනයේ නිරත වේ යැයි අපේක්ෂිත මධ්‍යයනය වසර ගණනයි.
4) ළදරු මරණ අනුපාතයයි.
5) ජනගහනයෙන් 1000 කට වෛද්‍යවරු සංඛ්‍යාවයි.

(46) පහත තොරතුරු X හා Y රටවලට අදාළ වේ.

| රට | 2021 ගිනි සංගුණකය | 2022 ගිනි සංගුණකය |
|---|---|---|
| X රට | 0.4 | 0.5 |
| Y රට | 0.6 | 0.4 |

ඉහත තොරතුරු වලට අනුව වඩාත්ම නිවැරදි නිගමනය කුමක්ද ?

1) X මෙන්ම Y පිළිබඳව ද ආදායම් විෂමතාවය හෙළි නොවෙයි.
2) X රටෙහි ආදායම් විෂමතාවය වැඩිවන ආකාරයෙන්ම Y රටෙහි ආදායම් විෂමතාවයද වැඩි වී ඇත.
3) X රටෙහි ආදායම් විෂමතාවය වැඩි වූ අතර Y රටේ ආදායම් විෂමතාවය අඩුවී ඇත.
4) X මෙන්ම Y දෙරටේම ආදායම් විෂමතාවය වැඩි වී ඇත.
5) X සහ Y යන දෙරටේම ආදායම් විෂමතාවය අඩු වී ඇත.

(47) මන්දගාමී ආර්ථික වර්ධනය වඩාත් යහපත් තත්ත්වයකට ගෙන ඒම සඳහා ශ්‍රී ලංකාව කටයුතු කළ යුතුව ඇත. මේ සඳහා කාලීනව වඩාත් සුදුසු කවර ක්‍රියාමාර්ගයක් ද?

1) දැනුම පදනම් කරගත් ආර්ථිකයක් ගොඩනැගීමට කටයුතු කිරීමය.
2) විදේශ රැකියා පදනම් කරගත් ආර්ථිකයක් ගොඩනැගීමය.
3) විදේශ ආයෝජන මත රඳා පවතින ආර්ථිකයක් ගොඩ නැගීමය.
4) සාම්ප්‍රදායික යැපුම් ආර්ථිකය දිරිමත් කිරීමය.
5) රාජ්‍ය ව්‍යවසායන් මූලික වන ආර්ථිකයක් ගොඩනැගීමය.

(48) සේවා නියුක්ති පිරිස මිලියන 12 ක් ද සේවා වියුක්ති අනුපාතය 20% ක්ද විය. ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 60% ක් නම් අවු. 15 ට වැඩි ජනගහනය කොපමණ ද?

1) මිලියන 15 යි.
2) මිලියන 20 යි.
3) මිලියන 22 යි.
4) මිලියන 25 යි.
5) මිලියන 30 යි.

(49) බෙංගාල බොක්ක අවට රටවල් අතර එකඟතාවය නම් බහු පාර්ශවීය වෙළඳ ගිවිසුම BIMSTEC ලෙස හැඳින්වේ. එයට අයත් රටක් නොවන්නේ,

1) ඉන්දියාවයි.
2) මාලදිවයින
3) මියන්මාරයයි.
4) ශ්‍රී ලංකාවයි.
5) තායිලන්තයයි.

(50) දුගී බව පිටුදැකීම සඳහා නව වැඩපිළිවෙලක් ලෙස 'අස්වැසුම' හඳුන්වා දී තිබේ. එයට අනුව අඩු ආදායම්ලාභීන් කාණ්ඩ හතරකි. ඊට අදාළ කණ්ඩායමක් ලෙස සැලකිය නොහැක්කේ මින් කවරක්ද ?

1) සංක්‍රාන්තික පිරිස
2) අවදානමට ලක් වූ පිරිස.
3) දුප්පත් පිරිස
4) අන්ත දුප්පත් පිරිස
5) නූගත් සහ විරැකියාවෙන් පෙළෙන පිරිස.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 03 |
|---|---|---|---|---|---|---|---|

**උපදෙස් :**

*** (අ) උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද (ආ) උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## (අ) - උප කොටස

(01) * ''ශ්‍රී ලංකාවේ දේශපාලන රටාව වෙනස් වෙමින් නව දේශපාලනික රාමුවක් වෙත ජනතාව විශ්වාසය තබා ඇත. පසුගිය පාලන කාලයන්හි ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ දිශානතිය වූයේ සාර්ව සංකල්ප පිළිබඳවය. නව දේශපාලනික රටාව හා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය වැඩිපුර යොමුව ඇත්තේ සූක්ෂම සංකල්ප කෙරෙහිය"

(i) ආර්ථික විද්‍යාවේ සාර්ව හා සූක්ෂම ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රයන් හඳුන්වා ඒවායින් අවධාරණය වන අංශ සඳහා ශ්‍රී ලංකා ආර්ථිකය ඇසුරින් නිදසුන් දෙන්න. (ල. 4)

(ii) "රටක ආර්ථික වෘද්ධිය ඉහළ යාම සඳහා ඉහළ සම්පත් සම්භාරයක් තිබීම ප්‍රමාණවත් නොවන බව පසුගිය දශක ගණනාවක් පුරා සිදු වූ ආර්ථික කඩා වැටීම් හමුවේ අවධාරණය කරගත හැකි විය. පවත්නා සම්පත් නිවැරදිව හසුරුවා ගැනීමට ව්‍යවසායකත්වයේ අවශ්‍යතාව දැඩිව පවතී." ව්‍යවසායකයාගේ මූලික කාර්යයන් නම් කරමින් මෙහි වලංගුතාව විමසන්න. (ල. 4)

(iii) ඉතා ඉහළ මානව ප්‍රාග්ධනයකට හිමිකම් කියන එමගින් ජාත්‍යන්තර වෙළඳාමට ප්‍රවිශ්ට වී සිටින රටවල් දෙකක් නම් කර මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීමට බලපාන සාධක 3 ක් නම් කරන්න. (ල. 5)

(iv) ලෝකයේ ආර්ථික පද්ධති වර්ගීකරණය සඳහා විවිධ නිර්ණායක භාවිතා කරයි. එලෙස භාවිතා කරන නිර්ණායක මොනවාද ? (ල. 3)

(v) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත නිපදවීමත්, ඒ මත සුදුසු ලක්ෂ්‍යය තෝරා ගැනීමත් යන දෙකම එකවර අත්කර ගැනීම යන්නෙන් කුමක් අදහස් වේද යන්න රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 4)

(02) (i) ඉල්ලුම කෙරෙහි බලපාන ඕනෑම තීරකයක වෙනස්වීම, ඉල්ලුම් වක්‍රය වෙනස්වීමකට සෑම විට ම තුඩු දෙන්නේ නැත. සමහර අවස්ථාවල දී ඉල්ලුම් වක්‍රය මත ලක්ෂ්‍ය වෙනස්වීම් ද දැකිය හැකිය. ඉල්ලුම් වක්‍රය මත ලක්ෂ්‍ය වෙනස්වන ආකාරය රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 4)

(ii) කෘෂි භාණ්ඩ නිපදවන සැපයුම්කරුවන්ගේ ආදායම් තත්ත්වය නිරන්තරයෙන් උච්චාවචනය වීමට බලපාන කරුණු දෙකක් සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ල. 4)

(iii) වමේ සිට දකුණට පහළට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක මිල ඉල්ලුම් නම්‍යතාව වෙනස් වන ආකාරය හා එතුළින් ව්‍යාපාර අයභාරය වෙනස් වන ආකාරය රූප සටහන් යොදා ගෙන පැහැදිලි කරන්න. (ල. 4)

(iv) එක්තරා භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් හා සැපයුම් තොරතුරු පහත වේ.

| මිල (P) | ඉල්ලුම් ප්‍රමාණය (Qd) | සැපයුම් ප්‍රමාණය (Qs) |
|---|---|---|
| 16 | 120 | 40 |
| 20 | 100 | 60 |

a) ඉහත තොරතුරු ඇසුරින් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ව්‍යුත්පන්න කරන්න. (ල. 2)

b) ඒ ඇසුරින් සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ල. 1)

c) සමතුලිත මිලේදී ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න. (ල. 1)

(v) විවිධ භාණ්ඩ වර්ගවල සැපයුම් නම්‍යතා සංගුණකයන් එකිනෙකට වෙනස් වීමට බලපාන හේතු මොනවාද ? (ල. 4)

(03) (i) නිෂ්පාදකයන් මත පැනවෙන ඒකක බද්දක් හා විශේෂිත බද්දක් අතර දක්නට ලැබෙන වෙනස යෝග්‍ය රූප සටහන් භාවිතයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(ii) රජයක් විසින් කිසියම් භාණ්ඩයක වෙළඳපළ සමතුලිත මිලට වඩා පහළ මිලක් නියම කළහොත් වෙළඳපළ තුළ හටගන්නා ආර්ථික ප්‍රතිවිපාක රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) අර්තාපල් අස්වනු නෙලන සමයේ අර්තාපල් ගොවීන්ගේ ආදායම ස්ථාවර කිරීම සඳහා රජයට ගතහැකි ක්‍රියාමාර්ග කවරේද ? (ල. 4)

(iv) තරගකාරී වෙළඳපොළක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත වේ.

$Qd = 120 - 20P \qquad Qs = 20P$

a) සමතුලිත මිලේ දී සැපයුම් නම්‍යතාව සොයන්න. (ල. 2)

b) සමතුලිත මිලේදී පාරිභෝගික පැහැදම සොයන්න. (ල. 2)

(v) රජය විසින් වෙළඳපොල තුළ සිටින නිෂ්පාදකයින්ට රු. 4 බැගින් වූ සහතික මිලක් ලබාදීමට තීරණය කර ඇත. එම මිල ආධාරක ප්‍රතිපත්තිය වෙනුවෙන් පහත ක්‍රම අනුගමනය කරන්නේ නම්,

a) අතිරික්ත සැපයුම රජය මිලට ගන්නේ නම් රජයේ පිරිවැය හා අහිමි වූ සුභසාධනය (DWL) සොයන්න. (ල. 2)

b) ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය යටතේ සහතික මිල ක්‍රියාවට නැගුවේ නම් රජයේ පිරිවැය හා අහිමි වූ සුභ සාධනය (DWL) සොයන්න. (ල. 2)


(04) (i) ඒකාධිකාරී තරඟ වෙළඳපොළක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ මොනවාද ? (ල. 3)

(ii) "ප්‍රාමාණික ලාභය වක්‍ර පිරිවැයේ මෙන්ම ස්ථාවර පිරිවැයේ ද සංරචකයකි" ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ දැයි පැහැදිලි කරන්න. (ල. 4)

(iii) a) පූර්ණ තරඟකාරී ආයතනයක කෙටි කාලීන හැසිරීම විග්‍රහ කිරීමේදී අදාළ වන පිරිවැය වක්‍ර කීයද ? ඒවා නම් කරන්න. (ල. 4)

b) ඒ එක් එක් පිරිවැය වක්‍රය මගින් ලබාගත හැකි නිගමනයන් මොනවාදැයි පැහැදිලි කරන්න. (ල. 3)

(iv) පූර්ණ තරඟකාරී වෙළඳපොළකට අදාළ වන මුළු අයභාරය හා මුළු පිරිවැය ප්‍රවේශය පහත රූප සටහනේ දැක්වේ.




* ඉහත ප්‍රස්තාරය ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a) මෙම ආයතනය ලාභ උපරිම කරන නිමැවුම් මට්ටම ඒකක කීයද ? එහිදී උපයන මුළු ලාභය කොපමණද ? (ල. 3)

b) මෙම ආයතනය ප්‍රාමාණික ලාභ උපයන්නේ කුමන නිමැවුම් මට්ටම් වලදී ද? (ල. 2)

c) ආයතනය අලාභ ලබන නිමැවුම් ඒකක පරාසය දක්වන්න. (ල. 1)

(05) (i) ජාතික ගිණුම්කරණයේදී ආර්ථික ප්‍රදේශය යනුවෙන් කුමක් අදහස් වේ දැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල. 3)

(ii) කල්පිත ආර්ථිකයක් සඳහා පහත දත්ත අදාළ වේ.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|
| * දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 680 |
| * පෞද්ගලික පාරිභෝජන වියදම | 7500 |
| * ආණ්ඩුවේ පාරිභෝජන වියදම | 3200 |
| * තොග වෙනස්වීම් | 110 |
| * වටිනාකම්හි වෙනස්වීම් | – 60 |
| * අපනයන | 500 |
| * ආනයන | 680 |
| * නිෂ්පාදනය මත ශුද්ධ බදු | 100 |
| * විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම් ලැබීම් | 950 |
| * විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම් ගෙවීම් | 1300 |
| * විදේශ ශුද්ධ ද්විතීයික ආදායම් | 400 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

a) වෙළඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය.

b) වෙළඳපොල මිලට දළ ජාතික ආදායම.

c) වැයකළ හැකි දළ ජාතික ආදායම. (ල. 2 x 3 = 6)

(iii) රටක ජනතාවගේ ජීවන තත්ත්වය මැනීම සඳහා දළ දේශීය නිෂ්පාදිතය යොදා ගැනීමේ දුර්වලතා මොනවාද ? (ල. 2)

(iv) a) සාර්ව ආර්ථික සමතුලිතය යනුවෙන් කුමක් අදහස් වේද ? (ල. 2)

b) සමතුලිත ජාතික ආදායම දැක්වීම සඳහා භාවිත කරන ප්‍රධාන ප්‍රවේශ දෙක රූප සටහන් මඟින් පැහැදිලි කරන්න. (ල. 4)

(v) a) එක්තරා ආර්ථිකයක් මුහුණ දී ඇති අර්බුදකාරී තත්ත්වය වළක්වා ගැනීම සඳහා රජය බදු රු. බිලියන 20 කින් කපා හරිනවාද, නැතහොත් රජයේ වියදම රු. බිලියන 20 කින් වැඩිකරනවා ද යන ප්‍රතිපත්ති පිළිබඳව විමර්ශනය කරමින් සිටියි. ආන්තික පාරිභෝජන නැඹියාව (MPC) 0.6 ක් වේ නම්, මෙම එක් එක් ක්‍රියාමාර්ගය තුළින් සමාහාර ඉල්ලුමට ඇතිවන බලපෑම පහදන්න. (ල. 2)

b) මෙම අර්බුදයෙන් මිදීමට වඩාත්ම උචිත ක්‍රියාමාර්ගය කුමක්ද ? (ල. 1)

## (ආ) - උප කොටස

(06) (i) මුදල් ඉල්ලුම හා ආදායම අතර මෙන්ම මුදල් ඉල්ලුම හා පොළී අනුපාතිකය අතරද සම්බන්ධතාවක් ඇත. මෙම ප්‍රකාශය පැහැදිලි කරමින් රූප සටහනකින් දක්වන්න. (ල. 6)

(ii) a) මහ බැංකුව අනුගමනය කරන ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ නම් කරන්න.

b) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය යනු කුමක්දැයි දක්වා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය අඩු කිරීමට ගනු ලබන තීරණයක් අධි බලැති මුදල් හා මුදල් සැපයුම කෙරෙහි බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ල. 6)

(iii) කල්පිත වාණිජ බැංකු පද්ධතියක් තුළ ක්‍රියාත්මක වන එක් වාණිජ බැංකුවක ඉල්ලුම් තැන්පතු රු. මි. 500 ක් ද, රු.මි. 100 ක සංචිත ද, රු. මි. 400 ක ණය ද වේ. මෙම බැංකු පද්ධතිය 10% ක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකයක් මත ක්‍රියාත්මක වේ.

a) මෙම බැංකුවට ලබාදිය හැකි උපරිම ණය මුදල කොපමණද ? (ල. 2)

b) ඉහත ණය මුදල ලබා දීමෙන් පසු ශේෂ පත්‍රය දක්වන්න. (ල. 2)

(iv) මහ බැංකුවේ කාර්යයන් අතර ශ්‍රී ලංකාවේ නිල ජාත්‍යන්තර සංචිත පවත්වාගෙන යාම සහ කළමනාකරණය කිරීම යටතේ සිදුකරන කාර්යයන් 4 ක් දක්වන්න. (ල. 4)

(07) (i) "වෙළෙඳපොළ ආර්ථිකයක පවත්නා අසාර්ථකවීම් හමුවේ ඒවා මැඩ පැවැත්වීම සඳහා රජය මැදිහත් වී විශාල කාර්යභාරයක් ඉටු කරයි. නමුත් රාජ්‍ය අංශයට ආවේණික වූ ඇතැම් දුර්වලතා හේතු කොට ගෙන එහි අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදේ."

ආණ්ඩුවක් අසමත් විය හැක්කේ කවර හේතුන් මතද ? (ල. 4)

(ii) "පුද්ගල ආදායම් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස මිනිසුන් තමන්ගේම පෞද්ගලික වාහන මිලදී ගනිති. එමනිසා පොදු ප්‍රවාහන සේවය අතහැර පෞද්ගලික වාහන භාවිතය ඉහළ යාමත් සමඟ විශාල මාර්ග තදබදයක් බිහි වේ."

මෙම තත්ත්වය වෙළඳපොළ තුළත් දැකිය හැකි ආකාරය රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 5)

(iii) ශ්‍රී ලංකාවේ 2022 මහ බැංකු වාර්තාව අනුව පහත අයිතම වල මෑත කාලීන උපනති පරීක්ෂා කරන්න. [දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශත ලෙස]

a) සමස්ත වියදම හා ශුද්ධ ණය දීම්.

b) පුනරාවර්තන වියදම්.

c) සමස්ත අයවැය අතිරික්තය / හිඟය (ල. 6)

(iv) "රාජ්‍ය ණය තිරසර මට්ටමක පවත්වා ගැනීම, වර්තමාන ශ්‍රී ලංකා රජය මුහුණ දෙන ප්‍රබල අභියෝගයක් වේ." මෙම අභියෝගය ජය ගැනීමට ඉදිරිපත් කරන යෝජනා කවරේද ? (ල. 5)

(08) (i) අන්තර්ජාතික වෙළඳාම යනු කුමක්දැයි හඳුන්වා එහි ආකාර නම් කරන්න. (ල. 3)

(ii) ආරක්ෂණවාදයේ ප්‍රධාන ස්වරූප 4 නම් කරන්න. (ල. 4)

(iii) පසුගිය දශක හතරක කාලය තුළ (1977 - 2022) අපනයන හා ආනයන සංයුතියේ හටගත් කැපී පෙනෙන වෙනස්කම් සඳහන් කරන්න. (ල. 4)

(iv) භාණ්ඩ වෙළඳ අනුපාතිකය අඩුවීම කෙරෙහි බලපාන හේතු 2 ක් හා එම අනුපාතිකය පහළ යාමේ ප්‍රතිවිපාක දෙකක් දක්වන්න. (ල. 4)

(v) ගෙවුම් ශේෂ ලේඛනය යනු කුමක්දැයි දක්වා පහත දැක්වෙන විදේශ ගනුදෙනු ගෙවුම් තුලන ලේඛනයේ මූල්‍ය ගිණුමේ කවර උප ගිණුමක වත්කම් වැඩිවීමක් /අඩුවීමක් සිදු කරන්නේ ද යන්න හෝ වගකීම් වැඩි වීමක් / අඩුවීමක් සිදුකරන්නේ ද යන්න දක්වන්න.

a) නේවාසික බැංකුවක් විදේශ රජයක පිළිණපත් මිලදී ගැනීම.

b) අනේවාසික සමාගමක් කොළඹ කොටස් හුවමාරුවෙන් සමාගම් කොටස් මිලදී ගැනීම.

c) අනේවාසිකයන් සිදු කරන ලද ප්‍රති ආයෝජන

d) ශ්‍රී ලංකා රජය ණය වාරික ගෙවීම. (ල. 5)

(09) (i) ආර්ථික වෘද්ධිය හා ආර්ථික වෘද්ධි අනුපාතය අතර වෙනස පැහැදිලි කර නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධිය සහ ආර්ථික වෘද්ධි අනුපාතයේ හැසිරීම පැහැදිලි කරන්න. (ල. 7)

(ii) රටක ඉතුරුම් - ආයෝජන පරතරය පියවීමට ගත හැකි ක්‍රියාමාර්ග ලියා දක්වන්න. (ල. 3)

(iii) ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනීම සහ තිරසාර සංවර්ධනය ඇති කර ගැනීම යන අරමුණු එකිනෙක ගැටෙන්නේද ? ඔබේ පිළිතුරු පැහැදිලි කරන්න. (ල. 5)

(iv) ආදායම් ව්‍යාප්ති විෂමතා මිනුම් කිරීමෙහිලා ලෝරන්ස් වක්‍රය හා ජිනී සංගුණකය ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න. (ල. 5)

(10) (i) ශ්‍රී ලංකා ආර්ථිකයේ දීර්ඝ කාලීනව පැවති දුර්වලතා කෙරෙහි බලපෑ දුර්වල ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග නම් කර එහි ප්‍රතිඵල ලෙස ආර්ථිකය තුළ ඇති වූ ගැටලු මොනවාදැයි දක්වන්න. (ල. 6)

(ii) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ අපේක්ෂා කරන ප්‍රධාන ප්‍රතිඵල මොනවාදැයි ලියා දක්වන්න. (ල. 4)

(iii) ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයෙහි විභව මට්ටමට ළඟා වීමට සහ විදේශ අංශයේ ස්ථාවරත්වය සහතික කිරීමට අපොහොසත් වීම කෙරෙහි බලපෑ හැකි හේතු මොනවාදැයි පැහැදිලි කරන්න. (ල. 6)

(iv) ගෝලීය නව්‍යතා දර්ශකයේ ප්‍රධාන උප දර්ශක දෙකකි. එම උප දර්ශක සඳහා අදාළ වන ප්‍රධාන නිර්ණායක මොනවාද ? (ල. 4)

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024
## ආර්ථික විද්‍යාව I (බහුවරණ) - පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 4 | (11) | 3 | (21) | 4 | (31) | 3 | (41) | 3 |
| (2) | 5 | (12) | 4 | (22) | 3 | (32) | 2 | (42) | 1 |
| (3) | 4 | (13) | 2 | (23) | 4 | (33) | 2 | (43) | 4 |
| (4) | 5 | (14) | 5 | (24) | 1 | (34) | 5 | (44) | 3 |
| (5) | 3 | (15) | 5 | (25) | 3 | (35) | 4 | (45) | 3 |
| (6) | 1 | (16) | 4 | (26) | 5 | (36) | 3 | (46) | 3 |
| (7) | 2 | (17) | 2 | (27) | 2 | (37) | 1 | (47) | 1 |
| (8) | 3 | (18) | 3 | (28) | 2 | (38) | 4 | (48) | 4 |
| (9) | 3 | (19) | 5 | (29) | 5 | (39) | 1 | (49) | 2 |
| (10) | 1 | (20) | 2 | (30) | 3 | (40) | 2 | (50) | 5 |

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024
## ආර්ථික විද්‍යාව II - පිළිතුරු පත්‍රය

### (අ) - උප කොටස

(01) (i) **සූක්ෂම ආර්ථික විද්‍යාව :**

ආර්ථිකයේ හදාරනු ලබන එක් එක් ඒකක තනි තනිව ගෙන හදාරනු ලබන විෂය ක්ෂේත්‍රය. එනම් එක් එක් ඒකක තනි තනිව ගනු ලබන තීරණ, හැසිරීම් ආදිය අධ්‍යයනය කිරීමයි.

උදා :- කුටුම්භ , ආයතන ආදිය (ල. 02)

**සාර්ව ආර්ථික විද්‍යාව :**

ආර්ථිකය සමස්තයක් ලෙස ගෙන එහි ව්‍යුහය, සාධනය, හැසිරීම්, තීරණ ආදිය පිළිබඳ අධ්‍යයනය කරනු ලබන විෂය ක්ෂේත්‍රය.

උදා : උද්ධමනය , සේවා වියුක්තිය, ද.දේ. නිෂ්පාදිතය (ල. 02)

(ii) ව්‍යවසායකයාගේ ප්‍රධාන කාර්යයන් 4.

1. අවදානම් ගැනීම.
2. ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
3. සාධක ඒකරාශී කිරීම.
4. නවෝත්පාදන බිහි කිරීම. (ල. 04)

(ල. 1 බැගින් 04 ක් දෙන්න.)

(iii) මානව ප්‍රාග්ධනය ඉහළම රටවල් :

සිංගප්පූරුව හොංකොං ජපානය කොරියාව

(ආදී ඕනෑම රටවල් 2 ක් සඳහා ල. 02)


| | |
|---|---|
| උදා : සන්නිවේදන කුසලතා | අධ්‍යාපනය හා පළපුරුද්ද |
| තාක්ෂණික කුසලතා | පුහුණුව |
| නිර්මාණාත්මක කුසලතා | සෞඛ්‍ය හා පෝෂණය |
| අත්දැකීම් | ආකල්ප |
| ගැටලු විසඳීම | |

(ආදී ඕනෑම උදාහරණ 3 කට ල. 03)

(iv) **නිර්ණායක**

* තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය
* දේපොළ හිමිකාරීත්වය.
* සානුබල වල ස්වරූපය.
* ආගමික දෘෂ්ටිවාදය.
* ආදායම් පුනර්ව්‍යාප්තිය හා සමාජ ආරක්ෂණ ජාල (ආදී ඕනෑම 3 කට ල. 03)

(v) ආර්ථික කාර්යක්ෂමතාවය = නිෂ්පාදන කාර්යක්ෂමතාව + සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව




B ලක්ෂ්‍යයේදී P = MC = MB වේ.

(ල. 02)

* වක්‍රය මත නිපදවීම යනු නිෂ්පාදන කාර්යක්ෂමතාවයයි. ඒ සඳහා කොන්දේසි 2 ක් ඉටුවිය යුතුය.


පූර්ණ සේවානියුක්තිය
පූර්ණ නිෂ්පාදිතය } A , B , C ලක්ෂ්‍ය මගින් පෙන්නුම් කරයි. (ල. 01)

* සුදුසු ලක්ෂ්‍ය තෝරා ගැනීම.

සමාජ වරණය පිළිබිඹු වන ලක්ෂ්‍යයයි. ඒ සඳහා P = MB = MC කොන්දේසිය ඉටුවිය යුතුය.

එය W ලක්ෂ්‍යයේදී ඉටු වේ. (ල. 01) (මුළු ල. 04)

(02) (i) ලක්ෂ්‍ය වෙනස්වීමට බලපානුයේ **මිල** වෙනස්වීමයි.




* මිල පහළ යාමකදී A සිට B ලක්ෂ්‍යය දක්වා B වක්‍රය දිගේ පහළට ගමන් කරයි.
* එය ඉල්ලුම් ප්‍රසාරණය වේ.
* මිල ඉහළ යාමකදී B වක්‍රය දිගේ ඉහළට ගමන් කරයි.

B සිට A දක්වා

* එය ඉල්ලුම් සංකෝචනයයි.

(මිල වෙනස්වීම ආකාර දෙකටම දක්වා ඇත්නම්, ල. 2 බැගින් 04 ක් දෙන්න. රූප සටහන් මගින්)

(ii) * ඉල්ලුම් අනම්‍ය වීම. * සැපයුම අනම්‍ය වීම.

**ඉල්ලුම අනම්‍ය වීම.**


* කෘෂි භාණ්ඩ සඳහා පවතින්නේ අනම්‍ය ඉල්ලුමකි. එමනිසා මිල කොතරම් පහළ ගියද ඉල්ලුම් ප්‍රමාණය ඊට සාපේක්ෂව ඉහළ යන්නේ අඩු ප්‍රමාණයකිනි.


එහිදී සැපයුම් කරුවන්ගේ ආදායම් මට්ටම වෙනස් වේ. (ල. 2)

**සැපයුම අනම්‍ය වීම.**

* කෘෂි භාණ්ඩ සඳහා සැපයුම අනම්‍ය වීම නිසා වෙළඳපොළෙහි මිල ගණන් ඉහළ යන කාලවලදී සැපයුම ඊට සාපේක්ෂව ඉහළ දැමීමේ හැකියාවන් නොමැති වීම නිසා ආදායම් මට්ටම වෙනස් වේ. (ල. 2)

(iii)




(ල. 01)

* ඉල්ලුම් වක්‍රය මත නම්‍ය ප්‍රදේශයේදී මිල පහළ යාම ව්‍යාපාරික අයභාරය උපරිම වේ. (ල. 01)
* ඉල්ලුම් වක්‍රම මත ඒකීය නම්‍ය ඉල්ලුම් ලක්ෂ්‍යයේ දී ව්‍යාපාරික අයභාරය උපරිමයට ළඟා වේ. (ල. 01)
* ඉල්ලුම් වක්‍රය මත අනම්‍ය ඉල්ලුම් ප්‍රදේශයේ දී මිල පහළට යාම ව්‍යාපාරික අයභාරය පහළ යාමට හේතු වේ. (ල. 01)

(iv) P Qd Qs

$$\left.\begin{matrix}16\\20\end{matrix}\right\}4 \qquad \left.\begin{matrix}120\\100\end{matrix}\right\}20 \qquad \left.\begin{matrix}40\\60\end{matrix}\right\}20$$

a) Qd = a – bp

$b = \frac{\Delta Qd}{\Delta P} = \frac{20}{4}$

b = 5

b = 5 තුළින් a

120 = a – 5 x 16

120 = a – 80

a = 200

∴ Qd = a – bp

Qd = 200 – 5p //

Qs = a + bp

$b = \frac{\Delta Qs}{\Delta P} = \frac{20}{4}$

b = 5

b = 5 a සෙවීම.

40 = a + 5 x 16

40 = a + 80

a = – 40

Qs = a + bp

Qs = – 40 + 5p // (ල. 02)

b) Qd = Qs

200 – 5p = – 40 + 5p

$\frac{240}{10} = \frac{10\,p}{10}$

p = 24 //

p = 24 Qd

Qd = 200 – 5p

= 200 – 5 x 24

= 200 – 120

Qd = 80

සමතුලිත මිල රු. 24/-

සමතුලිත ප්‍රමාණය ඒකක 80

c) $Qed = -b \times \frac{p\,x}{Qd\,x}$

$-5 \times \frac{24}{80}$ (ල. 01)

= – 1.5

(v) - සාධන සංචලන හැකියාව.

- භාණ්ඩයේ ස්වභාවය


- තොග පවත්වා ගෙන යෑමේ හැකියාව.

- මිල වෙනස්වීම හේතුවෙන් සැපයුම වෙනස්වීමට ගතවන කාලය. (ල. 4)

(03) (i) නිෂ්පාදකයන් මත පනවන ඒකක බද්දක් යනු නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ඒකකයක් මත කිසියම් රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් අයකර ගැනීමයි.


උදා :- හාල් 1 kg ක් සඳහා රු. 2/- ක බද්දක් ඇතිවිට (ල. 01)

මෙහිදී සැපයුම්කරු මත බදු අයකිරීම නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම තුළින් සැපයුමෙහි අඩු වීමක් සිදු වී බද්දේ ප්‍රමාණයෙන් සැපයුම් වක්‍රය වමට විතැන් වේ.




(ල. 01)


නිෂ්පාදකයින් මත විශේෂිත බද්දක් පැනවීම යනු ප්‍රතිශක්ත බද්දයි. මෙහිදී නිෂ්පාදනය කරන භාණ්ඩයේ වටිනාකම මත කිසියම් ප්‍රතිශතයක් බදු වශයෙන් අයකර ගැනීම වේ. මෙහිදී කිසියම් ප්‍රතිශතයක් මත බදු අයකිරීම නිසා සැපයුම් වක්‍රය වාමාවර්තව වමට විතැන් වේ. (ල. 01)




(ල. 01)

(ii) රජය විසින් කිසියම් භාණ්ඩයක වෙළඳපළ සමතුලිත මිලට වඩා පහළ මිලක් නියම කිරීම මගින් රජයේ උපරිම මිල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරේ.

මෙහිදී උපරිම මිල යනු, වෙළඳපළ ඉල්ලුම් සැපයුම් බලවේග අනුව තීරණය වූ සමතුලිත මිල පාරිභෝගිකයාට අසාධාරණ වෙතැයි සිතූ විට ඔවුනට යම් සහනයක සැලසීමට රජය විසින් නියම කරනු ලබන නීත්‍යානුකූල මිල වේ. (ල. 01)




* අධි ඉල්ලුම හට ගැනීම.
* තොග සඟවා ගැනීම් සිදුවීම.
* කළු කඩ මිලක් ජනිතවීම.
* නිෂ්පාදන හා පාරිභෝගික අතිරික්ත වලට වන බලපෑම.
* අහිමි වන සමාජ සුභසාධන (ල. 02)

(රූප සටහන 1, ඕනෑම පැහැදිලි කිරීම් 2 - ල. 02 ක් හිමිය.)

(iii) 1. සහතික මිල ක්‍රමයක් හඳුන්වාදීම.
2. ඌන පූර්ණ ගෙවීම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
3. ස්වාරක්ෂණ තොග රැස්කිරීම සහ මුදා හැරීම.
4. අපනයන සහනාධාර ලබාදීම.
5. ආනයනික අර්තාපල් සඳහා බදු පැනවීම. (ල. 04)

(iv) Qd = 120 – 20P    Qs = 20 P

a) Qd = Qs    P = 3    Qs = 20P


120 – 20p = 20p    = 20 x 3

$\frac{120}{40} = \frac{120p}{40}$    = <u>60</u>

<u>p = 3</u>    සමතුලිත මිල රු. 3/- ප්‍රමාණය ඒකක 60. (ල. 02)

b) පාරිභෝගික පැහැදම රු. 3/- x ඒකක 60 = රු. 180/- (ල. 02)

(v)




a) මිල රු. 4 දී Qd

Qd = 120 – 20p
= 120 – 20 x 4
= 120 – 80    ඒකක 80 දී Qd
= 40    Qd = 120 – 20p

මිල රු. 4 දී Qs = 20p = 20 x 4 = 80

$$80 = 120 - 20p$$

$$20p = 120 - 80$$

$$\frac{20p}{20} = \frac{40}{20}$$

$$p = 2$$

* අභිමිවන සුභ සාධනය $= \frac{2 \times 20}{2} = \frac{40}{2} =$ රු. 20

* රජයේ පිරිවැය $= 4 \times 40 =$ රු. 160/-

b) * අහිමි වූ සමාජ සුභ සාධනය $= \frac{2 \times 20}{2} =$ රු. 20 (ල. 02)

* ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය යටතේ රජයේ පිරිවැය

$= 2 \times 80 =$ රු. 160/- (ල. 02)

(04) (i) * ආයතන විශාල සංඛ්‍යාවක් පැවතීම.

* භාණ්ඩ ප්‍රභේදනය.
* ප්‍රවේශ බාධා නොතිබීම.
* සාධක සංචලනයට බාධා නොපැවතීම.
* දිගු කාලයේදී ප්‍රාමාණික ලාභ ලැබීම. (ල. 3)

(ii) එකඟ වේ.

* ප්‍රාමාණික ලාභය යනු ව්‍යවසායකයාගේ ආවස්ථික පිරිවැයයි. එනම් යම් නිෂ්පාදන ක්‍රියාවලියක නිරත වීම තුළින් ව්‍යවසායකයකු උපයා ගැනීමට අපේක්ෂා කරන අවම හෝ සාමාන්‍ය ලාභයයි. (ල. 2)

* වක්‍ර පිරිවැය තුළ ඇති සංරචකයක් ලෙසද ප්‍රාමාණික ලාභය දැක්වේ. එනම් යම් නිෂ්පාදන ක්‍රියාවලියක නිරත වීමේ අවම ඉපැයීමයි. එය ආවරණය නොවේ නම් තම ව්‍යවසායකත්ව හැකියාව එම නිෂ්පාදන කාර්යයෙන් ඉවත් කර ගනියි. ව්‍යවසායකත්වය ආයතනය සතු සාධකයක් බැවින් ප්‍රාමාණික ලාභය වක්‍ර පිරිවැයේ සංරචකයකි. (ල. 01)

* කෙටි කාලය තුළ නිමැවුම් සමඟ වෙනස් නොවන පිරිවැය ස්ථාවර පිරිවැය වේ. ප්‍රාමාණික ලාභය ද කෙටි කාලයේදී නිමැවුම සමඟ වෙනස් නොවන නිසා ස්ථාවර පිරිවැයේ ද සංරචකයකි. (ල. 01)

(iii) a) පිරිවැය වක්‍ර තුනකි.

* ආන්තික පිරිවැය වක්‍රය (MC)
* සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය (ATC) (ල. 04)
* සාමාන්‍ය විචල්‍යය පිරිවැය වක්‍රය (AVC)

b) * MC වක්‍රය - ලාභ උපරිම කරන නිමැවුම් මට්ටම දැන ගැනීමට (MR = MC වීමේදී)

* ATC වක්‍රය - ආයතනය නිෂ්ප්‍රාමාණික ලාභ උපයනවාද නැද්ද යනබව දැන ගැනීමට
  P > ATC නිෂ්ප්‍රමාණික ලාභ ලැබේ.
  ( P – ATC) x Q = ලාභය

* AVC වක්‍රය - ආයතනය වසා දමනවාද නිෂ්පාදනයේ නිරත වනවාද යන බව දැන ගැනීමට.
  P < = AVC සම් ආයතනය වසා දමයි. (ල. 1 x 3 = 03)

(iv) a) ලාභ උපරිම කරන නිමැවුම් මට්ටම ඒකක 60. (ල. 01)

ලාභය = ( TR – TC ) x Q

= ( 300 – 150 ) x 60

= 150 x 60

= රු. 9000 (ල. 02)

b) ප්‍රාමාණික ලාභ ලබනුයේ TR = TC වන විටදීය. එබැවින් නිමැවුම ඒකක 30 දී හා 70 දී ප්‍රාමාණික ලාභ ලබයි. (ල. 02)

c) නිමැවුම ඒකක 0 - 30 දක්වා පරාසයේදී ය. එහිදී TC > TR වේ. (ල. 01)

(05) (i) * සඵල ආර්ථික පාලනයක් සහිත තනි ආණ්ඩුවක් යටතේ පුද්ගලයන්ට භාණ්ඩ හා සේවා වලට සහ ප්‍රාග්ධනයට නිදහසේ සංචලනය විය හැකි භූගෝලීය ප්‍රදේශය ආර්ථික ප්‍රදේශ ලෙස හඳුන්වයි. (ල. 01)

* මෙහිදී දේශ සීමාව තුළ සිදුවන සියළුම ආර්ථික කටයුතු ආර්ථික ප්‍රදේශයට අයත් ලෙස නොසලකන අතර දේශ සීමාවෙන් බැහැරව සිදුවන ආර්ථික කටයුතු මීට ඇතුළත් වීමටද හැක. (ල. 01)

* උදා :- භූමි ප්‍රදේශය, මුහුදු සීමාව, ගුවන් අවකාශය වෙනත් රටවල ඇති පරිවාරක ප්‍රදේශ තානාපති කාර්යාල, කොන්සාල් කාර්යාල, හමුදා කඳවුරු. (ල. 01)

(ii) a) දළ දේශීය නිෂ්පාදනය = C + G + I + N$x$

= 7500 + 3200 + 730 + (– 180)

= 11250 (ල. 02)

I = ද.දේ. ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය + තොග වෙනස්වීම + වට්නාකම වෙනස්වීම

= 680 + 110 + ( – 60)

= 730

N$x$ = $x$ – m

= 500 – 680

= – 180

b) දළ ජාතික ආදායම = ද.දේ.නි + විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම

= 11250 + ( 950 – 1300)

= 11250 – 350

= 10,900 (ල. 02)

c) වැයකළ හැකි දළ ජාතික ආදායම = දළ ජාතික ආදායම + විදේශ ශුද්ධ ද්විතියික ආදායම

= 10900 + 400

= 11300 (ල. 02)

(iii) ජනතාවගේ ජීවන තත්ත්වය මැනීමට දළ දේශීය නිෂ්පාදිතය යොදා ගැනීමේ දුර්වලතා


* ද. දේ. නිෂ්පාදනය මගින් රටක නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය පිළිබඳව මැන දැක්වීමක් සිදු කරයි. ඒ තුළින් ජීවන තත්ත්වය දැන ගැනීමට අවශ්‍ය ගුණාත්මක මිනුම් පිළිබිඹු නොවේ.

* ජීවන තත්ත්වය කෙරෙහි සෘජුවම බලපෑම් කරන ආදායම් ව්‍යාප්ති විෂමතාවය පිළිබඳව ද.දේ. නිෂ්පාදිතය මගින් නිරූපණය නොවේ.
* ද.දේ. නිෂ්පාදනය තුළ ඇතුළත් භාණ්ඩ හා සේවා මිනිසුන්ගේ ජීවිතයේ ගුණාත්මක බවට බලපාන ආකාරය මේ තුළින් විස්තර නොකරයි.
* මිනිස් ජීවිතයේ ගුණාත්මක බව මැනීමට ඉතා වැදගත් විවේක කාලය ද.දේ. නිෂ්පාදිතය ගණනය කිරීමේදී නොසලකා හරියි. (කරුණු 2 කට ල. 02 යි.)

(iv) a) සමස්ත නිමැවුම / සමස්ත ආදායමත් සේවා නියුක්ති මට්ටමත් උච්චාවචනය නොවී පවත්නා මට්ටමෙහිම නොවෙනස්ව පැවතීම සාර්ව ආර්ථික සමතුලිතය ලෙස හඳුන්වයි. (ල. 02)

b) * සමාහාර ආදායම = සමාහාර වියදම

1) Y = E





(රූපසටහනට ල. 01)

2) Y = E රේඛාව සහ E රේඛාව ඡේදනය වන a ලක්ෂ්‍යයේ දී සමතුලිත ආදායම තීරණය වේ.

Y < E නම් ප්‍රසාරණය වේ.

Y > E නම් සංකෝචනය වේ. (විස්තරයට ල. 01)

3) කාන්දුවීම් = විදීම්




(රූපසටහනට ල. 01)

4) W සහ J රේඛා ඡේදනය වන b ලක්ෂ්‍යයේදී සමතුලිත ආදායම තීරණය වේ.

W > J නම් සංකෝචනය වේ.

W < J නම් ප්‍රසාරණය වේ. (විස්තරයට ල. 01)

(v) a) MPC = 0.6

$K_G = \frac{1}{1-b}$ $K_T = \frac{-b}{1-b}$

$K_G = \frac{1}{1-0.6}$ $K_T = \frac{-0.6}{1-0.6}$

$K_G = 2.5$ $K_T = -1.5$

$K_G = \frac{\Delta Y}{\Delta G}$ $K_T = \frac{\Delta Y}{\Delta T}$

$2.5 = \frac{\Delta Y}{20}$ $-1.5 = \frac{\Delta Y}{-20}$

$\underline{\Delta Y = 50}$ $\underline{\Delta Y = 30.0}$


සමාහාර ඉල්ලුම වැඩිවේ. (ල. 01) සමාහාර ඉල්ලුම වැඩිවේ. (ල. 01)

b) රජයේ වියදම රු. මි. 20 කින් වැඩි කිරීම වඩාත් උචිත වේ. ඒ තුළින් ආර්ථිකයට ඇතිවන ප්‍රසාරණාත්මක බලපෑම ඉහළයාම ඊට හේතුව වේ. (ල. 01)

## (ආ) - උප කොටස

(06) (i) * මිනිසුන් මුදල් ලඟ තබා ගැනීමට ඇති කැමැත්ත මුදල් ඉල්ලුම වේ.


* මුදල් ඉල්ලුම් කරනු ලබන්නේ,
  1. ගනුනෙු චේතනාවෙන් මුදලට කරනු ලබන ඉල්ලුම.
  2. ආරක්ෂණ චේතනාවෙන් මුදලට කරනු ලබන ඉල්ලුම.
  3. සමපේක්ෂණ චේතනාවෙන් මුදලට කරනු ලබන ඉල්ලුම.
* ගනුදෙනු චේතනාව සඳහා මුදල් ඉල්ලුම හා ආදායම අතර අනුලෝම සම්බන්ධතාවක් ඇත.
* පුද්ගලයාට ආදායම් ලැබීම් හා වියදම් කිරීම් එකිනෙකට නොගැලපීම නිසා ගනුදෙනු කිරීමේ අරමුණෙන් මුදල් ශේෂ ළඟ තබා ගැනීම ගනුදෙනු චේතනාව නිසා ඇතිවන මුදල් ඉල්ලුම ලෙස හඳුන්වයි.
* ආදායම් උපයන කාලයත්, වියදම් ගෙවන කාලයත් අතර පරතරය තුළ සිදුකළ යුතු ගනුදෙනු සඳහා මිනිසුන් මුදල් ශේෂ ළඟ තබා ගනියි.




(ල. 02)

* ආදායම් මට්ටම ඉහළ යාමේ දී ගනුදෙනු චේතනාවෙන් මුදලට කරන ඉල්ලුම ඉහත රූපසටහනෙන් දැක්වේ.
* ආරක්ෂණ චේතනාවේද මේ ආකාරයට විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න. (ල. 02)
* සමපේක්ෂණ චේතනාව සඳහා මුදල් ඉල්ලුම හා පොලී අනුපාතිකය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් ඇත.
* පිළිණපත්වල මුදල් ආයෝජනය කිරීමෙන් අනාගත ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණෙන් මුදල් ළඟ තබා ගැනීම සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුමයි.

* ජනතාව විවිධ වත්කම් ළඟතබා ගැනීමට පෙළඹෙන අතර සිය වත්කම් ගොනුවේ මුදල් හා පිළිණපත් අතර තේරීම් කිරීම පොලී අනුපාතිකය අනුව සිදුවේ. (ල. 02)




* රූප සටහනට අනුව පොලී අනුපාතිකය ඉහළ යන විට සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම අඩු වේ. පොලී අනුපාතිකය පහළ යනවිට සමපේක්ෂණ චේතනය යටතේ මුදලට ඇති ඉල්ලුම වැඩිවේ. (ල. 02)

(ii) * මහ බැංකු පොලී අනුපාතිකය

* ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය

* විවිධ වෙළඳපොළ අනුපාතිකය (ල. 03)

ව්‍ය. සංචිත අනුපාතය

වාණිජ බැංකු විසින් සිය තැන්පතු වගකීම් වලින් සංචිත ලෙස මහ බැංකුවේ මුදල් තැන්පතු ලෙස පවත්වාගෙන යායුතු ප්‍රතිපත්තියයි.

මුදල් නීති පනත අනුව වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව නිශ්චය කරන අවම ප්‍රමාණයක සංචිතය මහ බැංකුවේ පවත්වා ගෙන යා යුතුය. (ල. 01)

* ව්‍ය. සංචිත අනුපාතිකය අඩු කරනු ලබන විට මහ බැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු ප්‍රමාණයන් මහ බැංකුවෙන් ඉවත් වුවද අධි බලැති මුදල් සැපයුමෙහි වෙනසක් සිදු නොවේ. (ල. 01)

* ව්‍ය. සංචිත අනුපාතිකය අඩු කරනු ලබන විට තැන්පතු ප්‍රසාරණ ගුණකය ඉහළ යන බැවින් බැංකු සතු සංචිත ප්‍රමාණය පදනම් කරගෙන ලබාදිය හැකි ණය ප්‍රමාණය ඉහළ යයි. එහි ප්‍රතිඵලය ලෙස මුදල් සැපයුම වැඩිවේ. (ල. 01)

(iii) a) බැංකුවට ලබාදිය හැකි උපරිම ණය මුදල අධි සංචිතයට සීමාවේ.

අධි සංචිතය = රුපියල් මිලියන 50 කි.

උපරිම ණය රු. මිලියන 50 කි.

b)

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 550 | සංචිත | 100 |
| | | ණය | 450 |
| | | | 550 |

(iv) * විදේශ මුදල් වෙළඳපොළ උපකරණවල ආයෝජනය.

* විදේශ ස්ථාවර ආදායම් උපකරණවල ආයෝජනය සහ වෙළෙඳාම.

* හරස් මුදල් ගනුදෙනු හා රත්රන් සඳහා ආයෝජනය.


* සුරැකුම්පත් ණයට දීම, නැවත මිලදී ගැනීම සහ ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු.

* විදේශ විනිමය හුවමාරු සහ විදේශ විනිමය ඉදිරි වෙළෙඳපොළ ගනුදෙනු.
* දැනුවත් සහ අනාගත විදේශ විනිමය වගකීම් සපුරාලීම සඳහා ද්‍රවශීල විදේශ මුදල් වත්කම් තබාගනිමින් ද්‍රවශීලතාවය පවත්වා ගැනීම. (ඕනෑම කරුණු 4 කට ල. 04)

(07) (i) * ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයේ දක්නට ලැබෙන දෘඪතාවන්.
* දේශපාලන ස්වාර්ථය.
* ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල අවිදූර දෘෂ්ටිකත්වය.
* අපූර්ණ තොරතුරු මත ප්‍රතිපත්ති කරා එළඹීම.
* සානුබල කෙරෙහි අහිතකර ලෙස බලපෑම.
* පරිපාලන වියදම් ඉහළයාම. (ඕනෑම කරුණු 4 කට ල. 4)

(ii) කිසියම් ආර්ථික කටයුත්තක් නිසා ඊට ඍජුව සම්බන්ධ නොවන තෙවන පාර්ශ්වයන් වෙත ඇතිකරන, ආර්ථික කටයුත්තට ඍජුවම සම්බන්ධ අය විසින් සැලකිල්ලට නොගන්නා ප්‍රතිලාභ හෝ පිරිවැයයි. බාහිරතා ලෙස සැලකේ. (ල. 01)

* මෙම තත්වය ඍණ බාහිරතාවකි
* පරිභෝජනයේ ඍණ බාහිරතාවකි.




* $q_2$ - සමාජයීය ප්‍රශස්තය
* $q_3$ - වෙළෙඳපොල සමතුලිතය
* මෙම රූප සටහනේ, (ල. 02)
    * ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ PMB මගින් පෙන්නුම් කරන අතර, ආන්තික සමාජ ප්‍රතිලාභ SMB මගින් පෙන්නුම් කරයි.
    * සැපයුම් වක්‍රම මගින් පෙන්නුම් කරනුයේ පෞද්ගලික ආන්තික පිරිවැය වක්‍රයයි.
    * මෙම භාණ්ඩය පරිභෝජනය කරන පාරිභෝගිකයා එමගින් පෞද්ගලික ප්‍රතිලාභ හා පෞද්ගලික පිරිවැය පමණක් සැලකිල්ලට ගන්නා අතර ඔවුන්ගේ පරිභෝජන මට්ටම $q_3$ මගින් පෙන්නුම් කරයි. එතෙක් සමාජ ප්‍රශස්ත මට්ටම $q_2$ මගින් දැක්වේ.
    * මිල යාන්ත්‍රණය මගින් සමාජ ප්‍රශස්ත පරිභෝජන මට්ටම පෙන්නුම් නොකරන නිසා අධි පරිභෝජනයක් ඇති වේ.

      $q_2 - q_3$ - ප්‍රමාණය
    * එමගින් සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවක් පෙන්නුම් කරයි. (ල. 02)

(iii) a) සමස්ත වියදම හා ශුද්ධ ණය දීම්.

| 2020 | 2021 | 2022 |
|---|---|---|
| 19.4 | 20.0 | 18.5 |

b) පුනරාවර්තන වියදම්.

| 2020 | 2021 | 2022 |
|---|---|---|
| 16.3 | 15.6 | 14.6 |

c) සමස්ත අයවැය අතිරික්තය / හිඟය

| 2020 | 2021 | 2022 |
|---|---|---|
| – 10.6 | – 11.7 | – 10.2 |

(ඕනෑම දත්ත 2 කට ල. 2 බැගින් 2 x 3 = ල. 06)

(iv) * රාජ්‍ය අයභාරය ඉහළ නංවා ගැනීම.
* රාජ්‍ය වියදම් අවම කර ගැනීම හා තාර්කීකරණය කිරීම.
* විදේශ විනිමය අනුපාතිකය ස්ථාවරව පවත්වා ගැනීම.
* ආර්ථික වර්ධනය වේගවත් කිරීම.
* පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම. (ල. 05)

(08) (i) ලෝකයේ කිසියම් රටක් තවත් රටක් හෝ රටවල් කිහිපයක් හෝ සමග භාණ්ඩ හෝ සේවා හෝ ප්‍රාග්ධනය හුවමාරු කර ගැනීම විදේශ වෙළඳාම හෙවත් අන්තර්ජාතික වෙළඳාම ලෙස හැඳින්වේ. (ල. 02)

ආකාර : අපනයන වෙළඳාම , ආනයන වෙළඳාම (ල. 01)

(ii) * තීරුබදු (Tariffs)
* සලාක (Quotas)
* සම්බාධක පැනවීම (Embargoes)
* සහනාධාර ලබාදීම (Subsidies) (ල. 04)

(iii) කෘෂිකාර්මික අපනයන වල සාපේක්ෂ දායකත්වය අඩු වීම.

| 1977 | 2019 | 2021 | 2022 |
|---|---|---|---|
| 79 % | 20.6 % | 21.8 % | 19.6 % |

කාර්මික අපනයන ඉපැයුම්වල දායකත්වය ඉහළ යාම.

| 1977 | 2019 | 2021 | 2022 |
|---|---|---|---|
| 14 % | 78.9 % | 77.6 % | 79.8 % |

තේ වල සාපේක්ෂ අපනයන දායකත්වය අඩු වී රෙදිපිළි හා ඇඟලුම්වල සාපේක්ෂ දායකත්වය වැඩිවීම.

| | 1977 | 2019 | 2021 | 2022 |
|---|---|---|---|---|
| තේ | 53 % | 11.3 % | 10.6 % | 9.6 % |
| රෙදිපිළි | 2 % | 46.9 % | 43.5 % | 45.4 % |

(ල. 04)

(ඕනෑම කරුණු 2 කට 2 බැගින් ල. 04)

(iv) <u>හේතු</u> :

* අපනයන මිල දර්ශකය පහත වැටී ආනයන මිල දර්ශකය ඉහළ යාම.
* ආනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් අපනයන මිල දර්ශකය පහළ වැටීම.
* අපනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී ආනයන මිල දර්ශකය ඉහළ යාම
* ආනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී අපනයන මිල දර්ශකය පහළ වැටීම.

(ඕනෑම 2 කට ල. 02)

<u>ප්‍රතිවිපාක</u> :

* අපනයන හා ආනයන ශක්‍යතාව පහළ යාම.
* වෙළෙඳ ශේෂ හිඟය වැඩිවීම.
* ගෙවුම් ශේෂයේ සම්මත හිඟය වැඩිවීම.
* සංචිත හා වත්කම් අඩු වීම. (ඕනෑම කරුණු 2 කට ල. 02)

(v) ගෙවුම් ශේෂ තුලනය : වර්ෂයක කාල පරිච්ඡේදයක් තුළ රටක් විසින් සෙසු ලෝකය සමග කරන ලද ආර්ථික ගනුදෙනු හේතුවෙන් වෙනත් රටවලින් ලැබෙන විදේශ මුදල් හා විදේශ රටවලට ගෙවන විදේශ මුදල් හා ඒවා අතර වෙනස තුලනය කරන ආකාරය දක්වන ලේඛනයකි. (ල. 01)


a) විවිධ ආයෝජන ගිණුම - වත්කම් වැඩිවීම.
මුදල් හා තැන්පතු ගිණුම - වත්කම් අඩුවීම.

b) විවිධ ආයෝජන ගිණුම - වගකීම් වැඩිවීම.
මුදල් හා තැන්පතු ගිණුම - වත්කම් වැඩිවීම.

c) ඍජු ආයෝජන ගිණුම - වගකීම් වැඩිවීම.
මුදල් හා තැන්පතු ගිණුම - වත්කම් වැඩිවීම.

d) අනෙකුත් ආයෝජන ගිණුම - වගකීම් අඩුවීම.
මුදල් හා තැන්පතු ගිණුම - වත්කම් අඩුවීම. (ල. 04)

(09) (i) කිසියම් වර්ෂයක් සඳහා රටක ආර්ථික වෘද්ධි අනුපාතිකය ගණනය කිරීමෙන් වෘද්ධි ක්‍රියාවලිය හෝ විභව නිමැවුමේ වර්ධනය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගත නොහැකි ය. ආර්ථික වෘද්ධි අනුපාතිකයෙන් මැනෙනුයේ නිමැවුමේ හට ගත් සැබෑ වෙනස් වීම වේ. එහෙත් ආර්ථික වෘද්ධියෙන් සලකා බැලෙනුයේ ආර්ථිකයේ විභව නිෂ්පාදන ධාරිතාවේ ප්‍රසාරණයයි මෙය පහත රූපසටහනින් දැක්වේ. (ල. 02)




නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක ඇතුළත පිහිටි ලක්ෂ්‍යයක සිට නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යයකට විතැන් වීම (A - B) ආර්ථික වෘද්ධියක් නොවේ. එය ආර්ථකයේ ප්‍රයෝජනයට නොගත් සම්පත් උපයෝජනයට ගැනීම හේතුවෙන් සිදු වන සැබෑ මූර්ත නිමැවුමේ වැඩිවීම නිසා ය.

ආර්ථික වෘද්ධි අනුපාතිකයෙන් මැනෙන්නේ මෙම සැබෑ නිමවුමේ වැඩි වීම වේ. මෙය ආර්ථික වෘද්ධිය ලෙස වටහා ගත නොහැකි ය.

ඒ අනුව ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය පිළිබඳ කිසියම් තක්සේරුවක් කිරීම සඳහා වචන 10 ක් හෝ ඊට වැඩි කාල පරිච්ඡේදයකට අදාළ වාර්ෂික ආර්ථික වෘද්ධි අනුපාතිකයන්ගේ සාමාන්‍යය ගණනය කළ යුතුය.

නිෂ්පාදන හැකියා වක්‍රය PP සිට $P_1 P_1$ දක්වා ගමන් කිරීම තුළින් නිෂ්පාදන ලක්ෂ්‍යය දකුණට විතැන් වීම (B - C දක්වා) ආර්ථික වෘද්ධිය ලෙස සැලකේ. එමගින් නිෂ්පාදන හැකියාවේ වැඩි වීමක් නිරූපණය කෙරේ. (රූපසටහනට ල. 01, පැහැදිලි කිරීමට ල. 01)

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ වැඩි ම ආර්ථික වෘද්ධි අනුපාතිකය වාර්තා වුණේ 2012 වසරේ දී ය. එය 9.1% කි. අඩු ම ආර්ථික වෘද්ධි අනුපාතිකය වාර්තා වූයේ 2022 වසරේ දී ය. එය – 7.8% කි. පසුගිය වසර 5 ක සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය – 1.3% පමණ වේ. කොරෝනා ව්‍යසනය සහ ආර්ථික අර්බුදය හේතු කර ගෙන මෙම තත්ත්වය උදා වී ඇත.

| | | | |
|---|---|---|---|
| 1969 - 1978 | 3.8 % | 1979 - 1988 | 4.7 % |
| 1989 - 1998 | 5.0 % | 1999 - 2008 | 5.1 % |
| 2009 - 2018 | 5.3 % | 2019 - 2022 | – 1.3 % |

(සංඛ්‍යා ලේඛන සහිත පැහැදිලි කිරීමට ල. 02)

පසුගිය දශක පහක කාලයේ සාමාන්‍ය ආර්ථික වෘද්ධි අනුපාතිකය අඛණ්ඩ ව වර්ධනය වී ඇත. ඉන් ගම්‍ය වන්නේ ශ්‍රී ලංකාව ආර්ථික වෘද්ධි ක්‍රියාවලියක යෙදී සිටි බවයි. නමුත් එය ඉතා මන්දගාමී වෘද්ධි ක්‍රියාවලියකි. කොරෝනා වසංගතය සහ ආර්ථික අර්බුදය හමුවේ ආර්ථික වෘද්ධිය ආසන්න වර්ෂවල ඍණ අගයක් ගනු ලැබීය. (ල. 01)

(ii) - මූර්ත පොලී අනුපාතිකය ධනාත්මක කර ගැනීම (උද්ධමනය පාලනය කර ගැනීම.)
- මූර්ත වේතන හා ඉහළ ශ්‍රම ඵලදායිතාවයක් ළඟා කර ගැනීම.
- විදේශ විනිමය පාලන රෙගුලාසි ලිහිල් කිරීම.
- මූල්‍ය උපකරණ පරාසය පුළුල් කිරීම.
- වාණිජ බැංකුවලට ප්‍රවේශ විය හැකි අවස්ථා වැඩි කිරීම.
- නෛතික හා ආයතනික රාමුව ශක්තිමත් කිරීම.
- සංචාරක හා ප්‍රවාහන අංශයන්හි යටිතල පහසුකම් වර්ධනය කිරීම.
- අධ්‍යාපනය , සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය තුළින් සේවා ගිණුම යහපත් කරගැනීම.
- රාජ්‍ය මූල්‍ය විනයක් පවත්වා ගැනීම.

(එක් කරුණකට 1 බැගින් ඕනෑම කරුණු 3 කට ල. 03)

(iii) සෑම විටම ගැටෙන්නේ නැත.

- ආර්ථික වෘද්ධිය නිසා ආදායම් මට්ටම් ඉහළ යන බැවිනුත්, භෞතික ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීම සඳහා ඉහළ ආදායම් මට්ටමක් අවශ්‍ය වන බැවිනුත් ආර්ථික වෘද්ධිය තිරසාර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පොදුවේ පිළිගැනේ.
- එසේ වුව ද ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය හේතු කර ගෙන ආර්ථිකයේ හිඟ සම්පත් උපයෝජනය ඉතා වේගවත් වීමටත් ස්වභාවික ප්‍රාග්ධනය හායනයකට පාත්‍ර වීමටත් සමාජයීය විෂමතා පැන නැගීමටත් හැකි ය. වර්තමානයේ ආදායම් මට්ටම් වේගයෙන් ඉහළ යාම අනාගත ආදායම් විභවතාව පහළ හෙළීමට ද හේතු විය හැකි ය.
- ආර්ථික වෘද්ධිය සහ තිරසාර සංවර්ධනය අතර ගැටුම හැම විට ම දක්නට ලැබෙන්නක් ද නොවේ. ආර්ථික වෘද්ධිය හැම විට ම පාරිසරික හායනයට තුඩු දෙන්නේ නැත. ආර්ථික වෘද්ධි ක්‍රියාවලියෙහි ආරම්භක අදියරයන්හි දී පසුබෑමක් ඇති විය හැකි ය. එහෙත් ප්‍රතිශීර්ෂ ආදායම් වේගයෙන් වර්ධනය වන විට එම තත්ත්වය දක්නට නොලැබෙන අතර පරිසරයේ ගුණාත්මක තත්ත්වය ඉහළ යනු ඇත.
- පාරිසරික දූෂණය බොහෝ විට ජනගහනය සමග ඍජු සම්බන්ධයක් පෙන්නුම් කරයි. එහෙත් ජනගහනය ආර්ථික වෘද්ධිය සමඟ ප්‍රතිලෝම සම්බන්ධතාවක් දක්වයි. මේ අනුව ඉහළ ආර්ථික වෘද්ධි මට්ටමක් පරිසරයට හිතකර ලෙස බලපායි.

- තව ද ආර්ථික වෘද්ධ ක්‍රියාවලිය නිසා සමාජයේ ආදායම් මට්ටම් ඉහළ යාමකි. පුද්ගලයන්ගේ මූලික අවශ්‍යතාවන් තෘප්තිමත් වීමක් නිසා, සමාජ සාරධර්ම හා ප්‍රතිමානයන් වෙනස් විය හැකි ය. සමාජ විෂමතා හා පාරිසරික ගැටලු කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත. පරිසර හිතකාමී භාණ්ඩ පරිහරණයට පුද්ගලයන් වඩ වඩාත් යොමු වනු ඇත. වඩා කාර්යක්ෂම පරිසර-මිත්‍රශීලී නිෂ්පාදන ශිල්පක්‍රම භාවිතයට ගනු ඇත.
- ආර්ථික වෘද්ධියත් සමඟ ආදායම් ඉහළ යන විට තාක්ෂණය, පර්යේෂණ හා සංවර්ධන යන ක්ෂේත්‍රයන්හි වැඩි වැඩියෙන් ආයෝජනය කිරීමට අවස්ථාව සැලසේ. තාක්ෂණය ඉහළ යාම නිසා ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් උපයෝජනය සීමා කරමින් පරිසරය කෙරෙහි ඇති කරන අයහපත් ප්‍රතිවිපාක අවම කර ගැනීමට ද පිළිවන.

(එක් කරුණකට 1 බැගින් ඕනෑම කරුණු 5 කට ල. 05)

(iv) ව්‍යාප්ති විෂමතා මිනුම් කිරීමට පුළුල් වශයෙන් යොදා ගැනෙන මිනුම වනුයේ ජිනී සංග-ණකයයි. ආර්ථිකයේ ආදායම ව්‍යාප්තිය පූර්ණ සම තත්ත්වයෙන් කොතෙක් දුරට ඈත් ව තිබේ ද යන්න එමගින් මිනුම් කෙරේ. ලෝරන්ස් වක්‍රයත් $45^0$ රේඛාවත් අතර ප්‍රස්තාරික ප්‍රදේශය $45^0$ රේඛාවට පහතින් අති ප්‍රදේශය අනුපාතයක් වශයෙන් ජිනී සංගුණකය ගණනය කෙරේ. (ල. 01)

ලෝරන්ස් වක්‍රය ආදායම් අසමානතාව ඉතා සරල ආකාරයට ඉදිරිපත් කරයි. ජනගහනයෙන් කිසියම් ප්‍රතිශතයක් මුළු ආදායමෙන් කවර ප්‍රතිශතයක් හිමි කර ගන්නේ ද යන්න එමගින් පෙන්නුම් කෙරේ. සියලු දෙනා ම සමාන ආදායම් උපයන්නන් වේ නම් ව්‍යාප්ති රේඛාව හෙවත් ලෝරන්ස් වක්‍රය $45^0$ රේඛාව මත ම වැටේ. එබැවින් ලෝරන්ස් වක්‍රය $45^0$ රේඛාවෙන් දුරස් වෙත් ම ආදායම් ව්‍යාප්ති විෂමතාව ද වඩාත් දැඩි වේ. (ල. 01)

විවිධ කණ්ඩායම් අතර ආදායම් බෙදී ගොස් ඇති ආකාරයේ විෂමතා ජිනී සංගුණකය පෙන්නුම් නොකරයි. මුළු ජනගහනයේම විෂමතාවේ මාත්‍රය පිළිබඳ සමස්ත චිත්‍රයක් පමණක් එය සපයයි. එහෙත් ලෝන්ස් වක්‍රය විවිධ කණ්ඩායම් අතර ආදායම් බෙදීයාමේ විෂමතා වෙනස්කම් විස්තරාත්මකව පෙන්නුම් කරයි. (ල. 01)

සමාන ආදායම් සහ සමාන ජිනී සංගුණකය සහිත රටවල් වල පවා ආදායම් ව්‍යාප්ති රටාව වෙනස් විය හැකි ය. මින් අදහස් කරනුයේ ලෝරන්ස් වක්‍රය වෙනස් හැඩයක් ගනු ලැබුවද ජිනී සංගුණකය ආදායම් ව්‍යාප්තිය පිළිබඳ සපයන තොරතුරු නොමග යවන සුළු ය. උදාහරණයක් වශයෙන් කිසියම් ආර්ථිකයක ජනගහනයෙන් හරි අඩකට කිසිම ආදායමක් නොමැති බවත් ඉතිරි අඩ අතර මුළු ආදායම සමානව බෙදීයන බවත් උපකල්පනය කරමු. එවිට ජිනී සංගුණකය 0.5 ක් වේ. කිසියම් ආර්ථිකයක එක් කුටුම්භයක් හැර අනෙක් කුටුම්භ සමාන ආදායමක් භුක්ති විඳින අතර, එම එක් කුටුම්භය මුළු ආදායමින් හරි අඩක් හිමිකර ගන්නවා යයි සලකන්න. මෙම තත්ත්වය යටතේ දී ජිනී සංගුණකය 0.5 ක් වනු ඇත. මේ අනුව රටවල් ආදායම් විෂමතාව මත වර්ගීකරණය කිරීමේ දී ජිනී සංගුණකය සපයන තොරතුරු නොමඟ යවන සුළු ය. (ල. 02)

(10) (i) - නුසුදුසු කාලයක දී සිදු කළ බදු අඩු කිරීම.
- කිසිදු පූර්ව සූදානමකින් තොර ව කාබනික කෘෂි කර්මාන්තය වෙත කඩිනමින් යොමු වීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග.
- නොකැළැල් ණය සේවාකරණ වාර්තාවක් එලෙසම පවත්වා ගැනීමේ නිරර්ථක උත්සාහයන් මධ්‍යයේ රටේ නිල සංචිත අඩු වීම.
- විනිමය අනුපාතිකයෙහි ගැළපීම් ප්‍රමාද වීම මෙන් ම පූර්ව අනතුරු ඇඟවීම් කෙරෙහි අවධානය යොමු නොකිරීම. (එක් කරුණකට 1 බැගින් ඕනෑම කරුණු 3 කට ල. 03)

ප්‍රතිඵල ලෙස ඇති වූ ගැටලු

- උග්‍ර විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය සහ විදේශ විනිමය අනුපාතිකය මත පීඩනය සමඟ ගෙවුම් ශේෂය මත වූ පීඩනය ඉහළ යාම.

- ජීවනෝපායන් විශාල වශයෙන් අහිමි වීම මධ්‍යයේ උද්ධමනය අඛණ්ඩ ව ඉහළ යෑම හා ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම.
- රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා විශාල වීම.
- රාජ්‍ය ණය තිරසාර නොවන මට්ටම කරා ළඟා වීම හා අවදානම් අධි මිල විශාල ලෙස ඉහළ යාම.
- ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් දැඩි ලෙස පහත වැටීම හේතුවෙන් විදේශ මූල්‍යනය වෙත වූ ප්‍රවේශය සීමා වීම.
- සමාජ - ආර්ථික හා දේශපාලනික අර්බුද පෙර නොවූ අන්දමින් උත්සන්න වීම.
- ව්‍යාපාරික විශ්වාසය ශීඝ්‍රයෙන් පහළ යාම.

(එක් කරුණකට 1 බැගින් ඕනෑම කරුණු 3 කට ල. 03)

(ii)
- ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම.
- වැඩි දියුණු වූ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සහ රාජ්‍ය මූල්‍ය විනය.
- වැඩි දියුණු වූ පරිපාලන සහ වගවීමේ රාමුව සඳහා වන නීතිමය වෙනස්කම්.
- සමාජ ආරක්ෂණ ජාල ප්‍රතිසංස්කරණය කිරීම.
- මිල ස්ථායීතාව යළි ස්ථාපිත කිරීම.
- මූල්‍ය ආයතන සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව ශක්තිමත් කිරීම.

(එක් කරුණකට 1 බැගින් ඕනෑම කරුණු 4 කට ල. 04)

(iii)
- අහිතකර ආර්ථික තත්ත්වයන්

  නැවත ගොඩනැගීමේ අදියරේ දී බාහිර පරිසරය සහ පුළුල් ආර්ථික තත්ත්වයන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලය නිර්ණය කිරීමට ඉතා වැදගත් වේ. නිදසුනක් ලෙස පශ්චාත් ප්‍රතිව්‍යුහගතකරණ අවධිය තුළ ගෝලීය ආර්ථිකය මන්දගාමී වුවහොත් හෝ ප්‍රධාන බැංකු හවුල්කරුවන් ආර්ථික සංකෝචනයකට මුහුණ දෙන්නේ නම් රටක ආර්ථක වර්ධනයෙහි විභව මට්ටම සහ ගෙවුම් තුලනයේ තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම අපහසු විය හැකි ය.

  ශ්‍රී ලංකාවේ පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ අවධියේ ප්‍රමාණය යථා තත්ත්වයට පත්වීම අභියෝගයට ලක් කරමින් දැඩි මුදල් ප්‍රතිපත්ති හා මූල්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් මධ්‍යයේ 2023 වසරේ දී ගෝලීය ආනතින් ඉහළ යා හැකි බවට පූර්ව ලක්ෂණ දක්නට ලැබේ.

- ක්‍රියාවට නැංවීමේ අභියෝග

  බාහිර ණයකරුවන්ගේ සහ ඔවුන්ගේ අවශ්‍යතාවල විවිධත්වය මෙන් ම භූ දේශපාලනික අවශ්‍යතා අනුව ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ අදියර සංකීර්ණ විය හැකිය. මෙමගින් ණය හිමියන් සමඟ එකඟතාවකට එළඹීම අභියෝගාත්මක විය හැකි අතර එමගින් සාකච්ඡා දීර්ඝ වීම තුළින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙ ක්‍රියාවලිය ප්‍රමාද වීමේ අවදානම ඉහළ යා හැකිය. එමගින් ආයෝජකයින්ගේ විශ්වාසය පලුදු විය හැකි අතර විදේශීය අංශයේ ස්ථාවරත්වය නැවත ලබා ගැනීම ද දුෂ්කර විය හැකිය.

- ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවීම.

  ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සාර්ව රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ අවශ්‍ය ගැළපීම් අවධාරණය කරමින් කෙටි කාලීනව හා මැදි කාලීනව තිරසාර වර්ධන මාවතක් කරා ආර්ථිකය ගෙන යන ප්‍රතිපත්ති සංකලනයන් අනුගමනය කිරීමට අවශ්‍ය වේ. කෙසේ වෙතත් ප්‍රතිපත්තිමය ප්‍රතිචාර ඵලදායී ලෙස සැලසුම් කර නොමැති නම් හෝ ක්‍රියාත්මක කිරීමේ දී සම්බන්ධීකරණය අවම නම් අපේක්ෂිත ප්‍රතිඵලය ළඟා කර ගත නොහැකි ය. ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මුහුණ දෙන ආවේණික ගැටලු සලකා බලන විට අවශ්‍ය ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ ප්‍රමාණවත් තරම් ශක්තිමත් විය යුතු ය.

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

- දේශපාලන අස්ථාවරත්වය

ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම රඳා පවතින්නේ ණයහිමියන් සමග එකඟ වූ ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය සහ එහි දක්වා ඇති ඉලක්ක පිළිපැදීම මත ය. ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා ගත යුතු තීරණ ජනප්‍රිය තීරණ නොවන නිසා රජය එවැනි ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමේ දී දැඩි පීඩනයකට ලක් වනු ඇත. ඇතැම් විට ඡන්ද දායකයන්ගේ බලපෑම්වලට ඉඩ දීමට සිදුවිය හැකි ය. දේශපාලන ස්ථාවරත්වයක් පැවතීම, ආයෝජකයින් බහු පාර්ශ්වික හා ද්වි පාර්ශ්වික ණයහිමියන් ඇතුළු පාර්ශ්වකරුවන් අතර ආර්ථකය පිළිබඳ විශ්වාසය යළි ගොඩ නැංවීමට උපකාරී වනු ඇත. තව ද දේශපාලන අස්ථාවරත්වය ප්‍රතිපත්තිමය අසංගතතාවයට හේතු විය හැකිය. එය තිරසාර සාර්ව ආර්ථික ගැළපීම් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල බාධාවක් විය හැකිය. මේ අනුව පශ්චාත් ප්‍රතිව්‍යුහගත ආර්ථික පුනර්ජීවනය මෙන්ම ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව දේශපාලන ස්ථාවරත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම මෙන්ම ප්‍රතිසංස්කරණ සඳහා මහජන සහයෝගය මත තීරණය වනු ඇත.

- දුර්වල ආයතන

දුර්වල ආයතන නීතියේ ආධිපත්‍යය පිරිහීමට, විනිවිදභාවය හා වගවීම නොමැති වීමට සහ දූෂණය වැඩි වීමට හේතු වන අතර ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ඵලදායිතාව සීමා කරමින් සහ ආයෝජකයන්ගේ විශ්වාසය පලුදු කරමින් ආර්ථික වර්ධනයට අහිතකර පරිසරයක් නිර්මාණය කළ හැකි ය.

(පැහැදිලි කිරීම් සහිත එක් කරුණකට 2 බැගින් ඕනෑම කරුණු 3 කට ල. 06)

(iv) - ගෝලීය නවෝත්පාදන දර්ශකය ආදාන උප දර්ශකය සහ ප්‍රතිදාන උප දර්ශකය ලෙස උප අංශ 2 ක් යටතේ ගොඩනගා තිබේ.

* ආයතන
* මානව සම්පත් සහ පර්යේෂණ
* යටිතල පහසුකම්
* වෙළෙඳපොළ විචක්ෂණතාවය
* දැනුම හා තාක්ෂණය
* නිර්මාණාත්මක නිමැවුම් (කරුණු 4 කට ල. 04)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න